2024

වාර්ෂික කාර්යය සාධන වාර්තාව හා ගිණුම්

வருடாந்த செயலாற்று அறிக்கை மற்றும் கணக்கறிக்கை

Annual Performance Reports & Accounts



Rambakan oya Reservoir

Designed : IT Unit ,Distsec Ampara

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර්.
மாவட்ட செயலகம் - அம்பாறை.
District Secretariat - Ampara .

අම්පාර දිසාපතිතුමාගේ පණිවුඩය



2024 වර්ෂයේ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉටු කරනු ලැබූ සේවාවන් හා සිදු කරනු ලද ව්‍යාපෘතීන් කේන්ද්‍ර කොට ගනිමින්, වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටින් සහ තෘප්තියෙනි. 2002.09.12 දිනැති අංක 402 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයට අනුව, අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හී මූල්‍ය පාලනය පාදක කර ගනිමින් මෙම වාර්තාව පිළියෙල කර ඇත.

ගල්ඔය ගංගා නිම්නයේ ජනපදකරණයට යටත් වූ පැරණි දිගාමඩුලු ජනපදයට අයත් වූ වර්තමාන අම්පාර දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ ස්ථානගතව ඇත. කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ජාතික නිෂ්පාදනයේ විශාල පංගුවකට හිමිකම් කියන අම්පාර දිස්ත්‍රික්කය සාර්ථක කරදිය සහ මිරිදිය මත්ස්‍ය කර්මාන්තයෙන් ද රටෙහි පෝෂණ අවශ්‍යතා සපුරා ලීමට දායක වේ. විශ්ව විද්‍යාලයක්, උසස් තාක්ෂණ ආයතනයක්, අධ්‍යාපන විද්‍යා පීඨයක්, තාක්ෂණික පාසල, වෘත්තීය පුහුණු ආයතන මෙන්ම ජාතික පාසැල් ඇතුළු දියුණු කාර්මික පුහුණු ආයතන හා පාසල් පද්ධතියකින් සන්නද්ධව අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ ගුණාත්මක වර්ධනයක් ඇති කර ගැනීමට අම්පාර දිස්ත්‍රික්කය සමත් වී ඇත.

පාරිසරික වශයෙන් ආකර්ශනීය වූ ගල්ඔය ජාතික වනෝද්‍යානය, ආරුගම්බේ සර්ෆින් මුහුදු තීරය මෙන්ම, සංස්කෘතිකමය වශයෙන් වැදගත් වූ රජගල, දීඝවාපිය, මඟුල් මහා විහාරය, බුද්ධංගල, ඔකඳ දේවාලය, කඩක්කරෙ පල්ලිය යනාදියෙන් ද සමන්විත වීම නිසා දෙස් විදෙස් සංචාරකයන්ගේ පාරාදීසයක් බවට පත්වී ඇත.

විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරු පිරි දිස්ත්‍රික්කයක් ලෙස ගොඩනැඟෙමින් පවතින අම්පාර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන ජාතික වැඩසටහන් වන “අස්වැසුම” සමාජ ශුභ සාධන වැඩසටහන සහ කෘෂි නවීකරණ වැඩසටහන, දේශගුණ සුහුරු වාරි කෘෂි කර්මාන්ත ව්‍යාපෘතිය, වාරිමාර්ග අමාත්‍යංශය යටතේ ක්‍රියාත්මක වන දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහුඅදියර වැඩසටහන, ලෝක ආහාර වැඩසටහන, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන, ග්‍රාමීය ජීවනෝපාය නඟා සිටුවීම සඳහා ක්‍රියාත්මක කෙරෙනඋදු/මුං වගා ව්‍යාපෘතිය යනාදී සියලුම රජය මඟින් ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන් හරහා අදට සහ මතුවට ද කෘෂි කර්මාන්තයෙන් පරිපූර්ණ වූ නිරසර ගොවිතැනින් සුරක්ෂිත ආහාර වැඩපිළිවෙලක් දැයට දායාද කිරීම අරමුණු කොට ගත් මෙම ව්‍යාපෘති දිස්ත්‍රික්කයේ හෙට දවස වෙනුවෙන් සිදුවන මහඟු ආයෝජනයක් වනු ඇත.

කෘෂි ආර්ථිකය ජීවනාලිය කරගත් දිගාමඩුලු ගොවි ජනතාව, ආර්ථික වශයෙන් සවි බල ගන්වමින්, පවත්නා ගොවිපල පද්ධතිය නිරසර, හරිත ගොවි පද්ධතියක් බවට කළමනාකරණය කරමින්, යෝග්‍ය තාක්ෂණය උපරිම කාර්යක්ෂමතාවයෙන් භාවිත කර ප්‍රශස්ත ඵලදායීතාවයක් ලබා ගනිමින්, දිගාමඩුලු ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරමින් ජාතික ආර්ථිකයේ ප්‍රමුඛතම ආහාර නිෂ්පාදකයා වෙමින්, විදේශීය වෙළඳපොල කෘෂි නිෂ්පාදන ඔස්සේ ජය ගනිමින්, ගොවි ජනතාවගේ ජීවන තත්වය ඉහළ නැංවීම අපගේ මුඛ්‍ය පරමාර්ථය යි. එකී සුවහසක් ජනයාගේ ජීවිත විකසිත කරමින් ඉසුරු පිරි හෙට දිනයක් උදා කරනු වස් අදාළ චක්‍රෙල්ඛ, අණ පනත්, නීති රීති, රෙගුලාසි වලට අනුගත වෙමින්, එහෙත් හැකි උපරිමයෙන් ජනතාවගේ අභිවෘද්ධිය උදෙසා හැකි උපරිම ධාරිතාවය යොදවමින්, පළාතේ දේශපාලන අධිකාරියේ උපදෙස් සහ මඟපෙන්වීම යටතේ, රාජ්‍ය ප්‍රතිපත්තීන් කාර්යක්ෂමව ක්‍රියාවට නැංවීමේ අති භාර දූර වගකීම අපගේ උර මත පැටවී ඇත. මෙකී වගකීම ඉටු කිරීමේදී, මෙම කාර්ය සාධන වාර්තාවේ සඳහන් අරමුණු සහ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය අනුශාෂකත්වය ලබාදුන් සර්ව ආගමික නායකත්වය ද සහයෝගය ලබාදුන් දේශපාලන අධිකාරිය ද එයට අමතරව මෙම කර්තව්‍යයන් උදෙසා සෘජු හෝ වක්‍රව අප හා සම්බන්ධ වූ අම්පාර දිස්ත්‍රික්කයේ අනෙකුත් රාජ්‍ය, අර්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන සංවිධාන වල ප්‍රධානීන් සහ කාර්ය මණ්ඩල, සිවිල් සමාජ සංවිධාන, ග්‍රාමීය කමිටු යනාදීය ද ඉතා කෘතඥ පූර්වකව සිහිපත් කරමි.

මෙකී කාර්ය භාරය තුල, ඉහල කාර්ය සාධනයකින් යුතුව මෙම වාර්තාවේ සඳහන් ඉලක්ක කරා ළඟා වීම සඳහා ඉතා ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කළ පිරිස වූයේ ප්‍රාදේශීය ලේකම්වරුන්ය. ප්‍රාදේශීය ලේකම් කාර්යාල පද්ධතිය අතර සමායෝජනය හා කළමනාකරණය කරමින්, පසුගිය වසරේ දී අපගේ ඉලක්ක සපුරා ගැනීමට උපරිම දායකත්වය සැපයූ අතිරේක දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රධාන ගණකාධිකාරී, අධ්‍යක්ෂ (සැළසුම්) හා අනෙකුත් අධ්‍යක්ෂවරු, දිස්ත්‍රික් ඉංජිනේරු සහ සියලුම කාර්ය මණ්ඩලයටත් දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරුන් ප්‍රධාන එම කාර්යාලවල මාණ්ඩලික නිලධාරීන් ඇතුළු සමස්ථ කාර්ය මණ්ඩලයටත් මාගේ ප්‍රශංසාව පිරිනමමි.

එසේම, පවතින ආර්ථික අර්බුදය හමුවේ, සංවර්ධන වැඩසටහන් සහ අනෙකුත් රජය මැදිහත්වීමෙන් ක්‍රියාත්මක වන ජාතික, පළාත්, දිස්ත්‍රික් සහ අනෙකුත් ප්‍රාදේශීය මට්ටමේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී, පවත්නා උග්‍ර මූල්‍ය අර්බුදය නැමති බරපතල අභියෝගය ජයගනු වස් එම වැඩසහන් වලට සම්බන්ධ නිලධාරීන් සමඟ, අදාල අනෙකුත් පාර්ශව සමඟ සාකච්ඡා කොට, ඒ සඳහා විකල්ප ක්‍රමෝපායන් අවස්ථානෝචිතව යොදා ගනිමින්, එම වැඩසටහන් දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කර, අපේක්ෂිත ඉලක්ක කර ලගා වීමට හැකියාවක් ලැබුණු බව සතුටින් සිහිපත් කරන අතර, කර්මාන්ත, ස්වයංරැකියා, වෙළඳාම, සෞඛ්‍ය, ප්‍රවාහනය වැනි එදිනෙදා ජන ජීවිතය අඩාල නොවන පරිදි දිස්ත්‍රික්කය සාමකාමීව පවත්වාගෙන යාමට හැකිවූ බව සතුටින් සිහිපත් කරන අතර, ඒ සඳහා සෘජු සහ චක්‍ර අයුරින් දායක වූ සියලු නිලධාරීන් ඇතුළු මහජනතාවට මාගේ ප්‍රශංසාව පළ කරමි.

චින්තක අබේවික්‍රම,
දිසාපති/ දිස්ත්‍රික් ලේකම්,
අම්පාර දිස්ත්‍රික්කය.

Contents

01. **පරිච්ඡේදය** - **ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය** 1

1.1 හැඳින්වීම 1

විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරුපිරි දිස්ත්‍රික්කයක් - අම්පාර දිස්ත්‍රික්කය 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 4

1.3 ප්‍රධාන කාර්යයන් 5

1.4 සංවිධාන සටහන - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර 6

1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අනුබද්ධිත ආයතන 7

1.6 අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන 8

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) 8

02. **පරිච්ඡේදය** - **ප්‍රගතිය හා ඉදිරි දැක්ම** 9

03 පරිච්ඡේදය - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය 14

1.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 14

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 16

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 17

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 38

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 40

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 43

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 44

04. **පරිච්ඡේදය** - **කාර්ය සාධන දර්ශක** 63

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 63

05. **පරිච්ඡේදය** - **තිරසාර සංවර්ධන ඉලක්ක** (SDG) **සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සාධනය** 64

5.1 හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු දක්වන්න 64

5.2 ළඟා කරගත් තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම හා එහිදී මුහුණ දුන් අභියෝග කෙටියෙන් විස්තර කරන්න. 77

06 පරිච්ඡේදය - **මානව සම්පත් පැතිකඩ** 78

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 78

06.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපෑම 78

06.3 මානව සම්පත් සංවර්ධනය 79

07. **පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව** 80

01. **පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය**

1.1 හැඳින්වීම

<u>විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරුපිරි දිස්ත්‍රික්කයක් - අම්පාර දිස්ත්‍රික්කය</u>

පැරණි දිගාමඩුලු ජනපදයට අයත් වූ වර්තමාන අම්පාර දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ ස්ථානගතව ඇත. මෙහි භූමිය තැනින් තැන පිහිටි ශේෂ කඳුවලින් යුක්ත තැනිතලාවකි. මේ තැනිතලාව මුහුදු මට්ටමේ සිට සාමාන්‍යයෙන් අඩි 200 දක්වා ද හෙල් මුදුන්වල අඩි දහස දක්වා ද උස්ව පිහිටියේය. මේ සැබවින්ම සියල් සිරින් පිරි බිම් කඩෙකි. ඈත උෆවේ කඳුකරය පශ්චාත් භාග කොට ගත් අඳුරු වන තීරයෙන් ආරම්භ වී මෑත වෙරළ තීරය තෙක්ම එක එල්ලේ විහිදී ගිය මනහර වෙල්යායෙකි. එය පෙර රජ දවස දකුණු දිග වෙරළ තීරය දක්වාම පැතිර පැවතියෙකි. මේ පෙදෙසේ සිත්කළු දර්ශනය සෘතුවෙන් සෘතුව වෙනස් වෙස් ගෙන බැබළෙනි. වැසි කලට නිබඳ දියෙන් පිරීගත් කලපුවක සිරි ගන්නේය. ඊසාන මෝසම දුර්වල වෙද්දී පළාවන් ගොයමින් වැසි හරිත සමුද්‍රයක ශෝභාව පාන්නේය. ගොයම වැඩෙද්දී සිංහල ,දෙමළ හා මුස්ලිම් ගොවි දනන්ගේ පැල් වෙල් යායේ තැනින් තැන පැන නැඟ එයි. කුඹුර පැසෙද්දී ඈත වන තීරයෙන් එළි බැස එන අලින්, උෆරන්, මොණරුන් වැනි වන සතුන් මතු වෙයි. නැවත අස්වනු අස් කොට ගත් පසු මේ භූමිය එළ, මී, ගවයින් සිය ගණනින් සැදී රංචු සැරිසරන සුන්දර දර්ශනයක් මවයි. වියළි අගෝස්තුව වන විට දීප්ත සූර්ය රශ්මියෙන් පොළව දා ගිය කල සතෙකුට තණපතක් දිය බිදක් නැති කර්කශ, වේගවත් මාරුතයෙන් උඩ නැගී කැරකෙන දූවිල්ලෙන් වැසුණු බිමක් බවට පෙරළේ.

මඩකලපුව දිසාපතිවරයා යටතේ රටේ මහත්තුරුන් විසින් පරිපාලන රාජකාරී සිදු කරන ලද මෙම බිම් කඩෙහි 1924 දී වැව්ගම්පත්තුව නමින් නව පරිපාලන ඒකකයක් ස්ථාපිත විය. වැත්තෑවේ රටේ මහත්තයා එහි පළමු රටේ මහත්තයා වූ අතර, පැරණි වාරිමාර්ග නැවත පිළිසකර කිරීමේ කටයුතු වේගවත්ව එම කාලය තුළ දී සිදුව ඇත. එලෙස ඇරඹි සංවර්ධනයේ කූඨප්‍රාප්තිය සනිටුහන් කරමින් ඩී.එස්.සේනානායක ශ්‍රීමතාණන්ගේ මෙහයවීමෙන් ගල්ඔය සංවර්ධන ව්‍යාපාරය දියත් විය. එම ගොවි ජනපද ව්‍යාපාරයේ අනගිතම නිමවුම අම්පාර දිස්ත්‍රික්කයයි. වැව්ගම්පත්තුව, බින්තැන්නපත්තුව, පානම්පත්තුව, සම්මන්තුරේපත්තුව, නින්දවූර්පත්තුව, අක්කරපත්තුව ඇතුළු පැරණි පරිපාලන ඒකක එකතු කර 1961 වර්ෂයේදී අම්පාර නමින් වෙනම පරිපාලන දිස්ත්‍රික්කයක් ස්ථාපිත විය. 1961 අප්‍රේල් 10 දින ජේ.ඩී.එස්.ඩී ලියනගේ මහතා මෙහි පළමු දිසාපතිවරයා ලෙස පරිපාලන රාජකාරී ඇරඹීය. 80 දශකයේදී මහවැලි සංවර්ධන ව්‍යාපාරය යටතේ මහවැලි සී කලාපය හෙවත් දෙහිඅත්තකණ්ඩිය ප්‍රදේශය ද මෙම දිස්ත්‍රික්කයට එක් විය. වර්තමාන අම්පාර දිස්ත්‍රික්කය සම්මන්තුර ,කල්මුණ, පොතුවිල්, අම්පාර යන ඡන්ද ප්‍රදේශ 04 ක්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 19ක් හා උප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්, ග්‍රාම නිලධාරී වසම් 503 ක් හා ගම්මාන 614 කින් සමන්විතය. ඒ අතර, මහනගර සභා 02 ක් නගර සභා 01 ක් ප්‍රාදේශීය සභා 17 ක් හා පොලිස් ස්ථාන 14 ක් පවතී. කිලෝමීටර් 115 ක් පුරා දිවෙන දර්ශනීය වෙරළ තීරය ද, තැනින් තැන පිහිටි ශේෂ කඳු ද, ගමින් ගම පිහිටි නිල්දිය පිරි මහ වැව් ද, ඒ වැව් ඔස්සේ ඊදෙන හරිත වෙල් යාය ද, වන සතුන් නිදහසේ සරනා වන ගොමු ද, මෙම දිස්ත්‍රික්කයේ සුන්දරත්වය සේම වටිනාකම ද ඉහළ නංවයි. දිස්ත්‍රික්කයේ බහු ආගමික, බහු සංස්කෘතික උරුමයන් විදහා දක්වමින් විහාරස්ථාන 223 ක් ද, හින්දු කෝවිල් 203 ක් ද, මුස්ලිම් පල්ලි 369 ක් හා ක්‍රිස්තියානි පල්ලි 74 ක් ද පවති.

ජන සංඛ්‍යා ලේඛණ දත්තවලට අනුව (දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛණ 2019) අම්පාර දිස්ත්‍රික්කයේ ජනගහනය සමස්ථ ජනගහනය 728,086 කි. පවුල් සංඛ්‍යාව 205,211 ක් වේ. මෙම සමස්ථ ජනගහනය තුළ 41.49% ක් මුස්ලිම් ජනතාව ද, 35.32% ක් සිංහල ජනතාව ද 22.581% ක් දෙමළ ජනතාවගෙන් හා 0.6% ක් අනෙකුත් ජනතාව ද නියෝජනය වන අතර, මෙම සියලු ජාතීන් සමඟියෙන් හා සහජීවනයෙන් ජීවත් වෙති.

මෙම දිස්ත්‍රික්යේ වපසරිය වර්ග කිලෝමීටර් 4,415 ක් වේ.. මෙහි සමස්ථ වගා බිම් ප්‍රමාණය වර්ග කිලෝමීටර් 1,264.47 කි. අභ්‍යන්තර ජලාශ ලෙස වර්ග කිලෝමීටර් 328.03 ද වනාන්තර ප්‍රමාණය (Forest & Range Land) වර්ග කිලෝමීටර් 2,097.53 ක් ද වේ. මෙහි වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 1,886 ක් පමණ වන අතර, සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 29.81 ක මට්ටමේ පවතී.

දිවයිනේ විශාලතම ජලාශය වන සේනානායක සමුද්‍රය ආශ්‍රිත වාරි පද්ධතිය මඟින් පෝෂණය වෙමින් ශ්‍රී ලංකාවේ ජාතික වී නිෂ්පාදනයෙන් 22.5% ක් දැයට උරුම කරමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ '' ජාතියේ වී බිස්ස" යන විරුදාවලිය ලත් අම්පාර දිස්ත්‍රික්කය උක් වගාව, අතිරේක බෝග වගාව, පශු සම්පත් සහ

සාර්ථක කරදිය හා මිරිදිය ධීවර කර්මාන්තය තුළින් ජාතික ආහාර නිෂ්පාදනයේ ප්‍රමුඛස්ථානය හිමි කරගෙන ඇත.

විශ්ව විද්‍යාලයක්, උසස් තාක්ෂණ ආයතන, අධ්‍යාපන විද්‍යා පීඨයක්, තාක්ෂණික විද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන මෙන්ම ජාතික පාසල් ඇතුළු දියුණු පාසල් පද්ධතියකින් සන්නද්ධව අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ ගුණාත්මක වර්ධනයක් ඇති කර ගැනීමට අම්පාර දිස්ත්‍රික්කය සමත් වී ඇත. ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් ඵලදායිතා සම්මානයන්ගෙන් පිදුම් ලත් සෞඛ්‍ය සේවයක් දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වීම ගොවි ජනයා ප්‍රමුඛ ප්‍රදේශවාසීන්ට මහත් අස්වැසිල්ලක් වී ඇත.

පාරිසරික වශයෙන් ආකර්ෂණීය වූ ගල්ඔය ජාතික වනෝද්‍යානය, කුමන ජාතික කුරුලු උයන, ලාහුගල ජාතික වනෝද්‍යානය, ආරුගම්බේ සර්ෆින් මුහුදු තීරය මෙන්ම, සංස්කෘතිකමය වශයෙන් වැදගත් වූ රජගල, දීඝවාපිය, මගුල් මහා විහාරය, බුද්ධංගල, ඔකඳ දේවාලය , කඩක්කරෙ පල්ලිය යනාදියෙන් ද සමන්විත වීම නිසා දෙස් විදෙස් සංචාරයන්ගේ පාරාදීසයක් බවට පත්ව ඇත.

අම්පාර දිස්ත්‍රික්කයේ ඓතිහාසික පසුබිම

පුරාණ ලංකාව රුහුණු,මායා,පිහිටි යනුවෙන් රාජ්‍යයන් තුනක් වශයෙන් පැවතුණි. රුහුණු රාජධානියේ ඉතා වැදගත් දනව්වක් වශයෙන් සැලකූ දීඝවාපි හෙවත් දිගාමඩුලු රාජධානියේ ඉතිහාසය බුද්ධ කාලය දක්වා ඈතට යන බව ඓතිහාසික තොරතුරු වලින් සනාථ වෙයි. වංශ කථාවන්ට අනුව විජය ලංකාවට ගොඩබසින ලද්දේ බුදුරජාණන් වහන්සේගේ පිරිණිවන් පෑම සිදුවූ දිනයේය.මණිඅක්ඛිත නා රජුගේ ඇරයුමෙන් බුදුරජණන් වහන්සේගේ තුන්වන වරට ලක්දිවට වැඩම කරන ලද කල්‍යාණ ගමනේදී දීඝවාපියට වැඩම කරවීම ගැන සඳහන් වේ.

අම්පාර ප්‍රදේශය ආර්ය ජනාවාසයක් බවට පත්වී ඇත්තේ විජය රජුගෙන් පසු පාලකයා බවට පත්වූ පඬුවස් දෙවි රජුගේ අවධියේය. පඬුවස් දෙවි රජුගේ බිසව වන භද්දකච්චායනා කුමරිගේ සහෝදරයකු වූ දීඝායු කුමරු විසින් පිහිටුවන ලද දීඝායුගාම පසුව දීඝවාපි,දිගාවැව හා දිගාමඩුල්ල යන නම් වලින් හැඳින්වුන බව වංශ කථාවන්ට අනුව සඳහන් වී ඇත.

දීඝගාමිණීගේ පුත් පණ්ඩුකාභය කුමරු විසින් අනුරාධපුරය සිය අනසකට ගෙන අනුරාධපුරයෙහි අගනුවර පිහිටවනු ලැබීය.මෙතැන් සිට දිගාමඩුල්ල අනුරපුර මහ රජුගේ එක් ප්‍රාදේශීය පාලන කොට්ඨාශයක් වූ අතර, එය ප්‍රධාන ධාන්‍යාගාරය වේ.පොළොන්නරු රාජධානිය බිඳ වැටී පාලන අධිකාරිය නිරිත දිග ප්‍රදේශයට තල්ලු වීමත් සමඟ අම්පාර ප්‍රදේශය වල් බිහිවන්නට විය.

මහසෙන් රජුගේ මහා වාරි කර්මාන්ත ව්‍යාපාරය නැගෙනහිර බින්තැන්නේ සිට තමන්කඩුව හා සේරු නුවර ඔස්සේ නුවර කලාපය තෙක් පැතිරී ඇත. ස්වකීය සංවර්ධන කටයුතුවලදී රුහුණ අමතක නොකළහ. දීර්ඝ කාලයක් නිස්සේ වර්ධනය වූ වාරි කර්මාන්තයට නෂ්ඨාවශිෂ්ට අම්පාර ප්‍රදේශය තුළ සිසාරා ඇවිද යන විට දැකිය හැක.

ලංකාවේ ඉතිහාසය ශිලා ලේඛන ගත කිරීමට පෙර ගල්ඔය මිටියාවත වැදි ජනතාවගේ ගොදුරු බිමක්ව පැවති බව ආචර්ය ආර්.එල්. බ්‍රෝහියර් මහතා සඳහන් කර ඇත. මුල් ආර්යයන් විසින් පිහිටවුනු ක්‍රි.පූ.03 වන සියවස දක්වා දිවෙන සෙල්ලිපි වල දක්නට ඇත.

අම්පාර දිසාවේ ඉතිහාසය පිළිබඳව කථාකරන කළ රජගල ප්‍රදේශය වටිනා ඓතිහාසික තොරතුරු රැසක් ලැබී ඇති ප්‍රදේශයකි. මෙහි දක්නට ලැබෙන චෛත්‍යයක නටඹුන් අසල පිහිටා ඇති සෙල් ලිපියක "යෙ ඉමදිය පටමය අගනන ඉධීක තෙර මහිද තෙර තුබෙ "යන වාක්‍ය කොටා ඇත.මේ අනුව එම චෛත්‍යය මෙම ද්වීපයේ අභිවෘද්ධිය සඳහා පැමිණි ඉට්ඨීය හා මහින්ද තෙරුන්ගේ දාගැබ ලෙස හඳුන්වා දී ඇත.මෙය මිහිදු හිමියන්ගේ ලංකා ගමන හා ඒ සමඟ පැමිණි ඉට්ඨීය හිමියන් පිළිබඳ මහා වංශ පුවත සනාථ කරන්නකි. මිහිදු හිමි පිරිනිවන් පෑ පසු දාතුන් නිදන් කර රටපුරා දාගැබ් ගොඩ නංවා ඇති බවට වන පුවතද සනාථ කරන්නකි.මේ අතරම රජගලින් ලැබී ඇති තවත් ලිපියක දුටුගැමුණු රජුගේ බිසවක් සේ හඳුන්වා ඇති රජිතා නම් කාන්තාව ගැන සඳහන් වේ. මෙය ඓතිහාසික වශයෙන් අතිශය වැදගත් ලිපියකි. එසේම නන්දිමිත්‍ර යෝධයාගේ හා දුටුගැමුණු රජුගේ පවුල් දෙක අතර විවාහ සබඳතාවක් පිළිබඳ සාධකයක් සපයන සෙල් ලිපියක්ද රජගලින් සොයාගෙන ඇත. මේ සෙල් ලිපිය හා අම්පාර දිස්ත්‍රික්කයේ

බමුණුගල සෙල් ලිපියත් එකට සලකා බැලීමේදි දුටුගැමුණු රජුගේ දියණිය නන්දිමිත්‍රගේ පුතෙක් සමග විවාහ වී සිටි බවට සාක්ෂි සැපයේ.

දසවැනි සියවසට අයත් කොණ්ඩුවටුවාන් සෙල්ලිපිය සුවිශේෂී වැදගත් කමක් ඇති ඓතිහාසික මූලාශ්‍රයක් ලෙස විද්වත්තු පිළිගනිති. එම සෙල්ලිපියට අනුව අනුරාධපුර යුගයේ අවසාන භාගය වන විටත් අම්පාර සශ්‍රීක සිංහල ජනාවාසයක් වූ බව පැහැදිලිව ඔප්පු කරයි. එකී ගම් ස්වයංපෝෂිත ගම්මාන බව " අලෙවිය සඳහා පිටතින් බඩු නොගෙන්විය යුතු බවට" කර ඇති නියෝගයන් ඇත. එසේම මෙම ප්‍රදේශය අනුරාධපුර රාජධානියට අයත්ව පාලනය වූ බවට තොරතුරු මෙකී සෙල් ලිපියෙන් ප්‍රකාශ වේ.

පොළොන්නරු යුගයේදී අම්පාර වැදගත් තැනක් හිමිකරගත් බවට සාක්ෂි ඉතිහාසයෙන් ලැබේ. සොලී ආධිපත්‍යයෙන් රට මුදාගෙන රට එක්සත් කිරීම සඳහා ගෙන ගිය මහා විජයබාහු (1055-1110) රජුගේ විමුක්ති ව්‍යාපාරයට ද දිගාමඩුල්ල උපකාරී වූ බවට තොරතුරු ඇත.එතුමා දිගාමඩුල්ලේදී කළ සටන් කිහිපයක් ගැන සඳහන් වේ.සුගලා රැජිනගේ ආධිපත්‍යයට දිගාමඩුල්ල අවනතව තිබූ බවට තොරතුරු ලැබිණි.මහා පරාක්‍රමබාහු (1153- 1186) රජතුමා දන්ත දාතුන් වහන්සේ ලබාගැනීම සඳහා සුගලා රැජිණ සමග යුද්ධ කරන ලද්දේ දීඝවාපියේදී බව ලංකා විශ්ව විද්‍යාලයේ ලංකා ඉතිහාසයේ ග්‍රන්ථයේ සඳහන් වෙයි. මෙයින් පැහැදිලි වන වැදගත් කරුණ වන්නේ ලංකා ඉතිහාසයේ එක් අවධියක දළදා වහන්සේගේ අයිතිය දීඝවාපියට හිමිව තිබූ බවය. කීර්ති ශ්‍රී රාජසිංහ රජු 1756 වර්ෂයේදී දීඝවාපියට පැමිණ දීඝවාපී දාගැබ ප්‍රතිසංස්කරණය කරවා එම විහාරස්ථානය බන්ඩිගොඩේ නීග්‍රෝධ නායක හිමියන්ට පූජාකළ බවට දීඝවාපී සන්නසේ සඳහන් වේ. මේ පුවත වංශ කථා පුවත් වලින් ද සනාථ වන අතර, දීඝවාපි චෛත්‍යයේ බටහිර වාහල්කඩේ මෑතක් වනතුරු දැකගන්නට තිබූ දුර්වර්ණ වී ගිය චිත්‍ර සටහන් නුවර යුගයට අයත් චිත්‍ර සම්ප්‍රදායට අයත් බව පෙනී ගොස් තිබුණි.

1818 න් පසුව අම්පාර ප්‍රදේශයේ සිදු වූ වැදගත් සිදුවීමක් ලෙස පෙන්වා දිය හැක්කේ වාරි කර්මාන්ත සංවර්ධනයේ ලා බ්‍රිතාන්‍යයන් දැක්වූ දායකත්වයයි. විශේෂයෙන්ම 1853 දී සර් හෙන්රි වෝඩ් ආණ්ඩුකාරවරයා නැගෙනහිර පළාතේ අම්පාර ප්‍රදේශයට පැමිණ මේ ප්‍රදේශයේ වාරි කර්මාන්ත සංවර්ධනය සඳහා මුදල් යෙදවීමේ වැදගත්කම පිළිබඳ අවබෝධ කර ගැනිම වාරිකර්මාන්ත පුනරුත්ථාපනය සඳහා එවක බ්‍රිතාන්‍ය රජයේ මුදල් යෙදවීම ආයෝජනය කිරීමක් සඳහා හේතු විය. මේ යටතේ අම්පාර දිස්ත්‍රික්කයට අයත් දිවුලාන, දඩයන්තලාව, සාගම වැනි ජලාශ පුනරුත්ථාපනය කිරීමත්, 1880 දශකයේදි පට්ටිපොල ආරු ව්‍යාපාරයේ ආරම්භ කිරීමත් සුවිශේෂී සිදුවීමක් විය. පට්ටිපොල ආරු යෝජනා ක්‍රමය යටතේ අම්පාර වැව, කොන්ඩුවටුවාන වැව, එරගම වැව ආදී ජලාශද ගල්ඔය දිගට, අමුණු රැසක්ද ඉදිකර අක්කර 40000 කට ආසන්න ප්‍රමාණයකට වගාවන් සඳහා ජලය ලබාදීමත් සමඟ දිවයිනේ විශාලතම කුඹුරු යාය අම්පාර ප්‍රදේශයෙන් ඉදි කෙරුණි.

ඉන්පසුව 1930 දශකය වන විට ගල්ඔය වාරිමාර්ග යෝජනා ක්‍රමය පිළිබඳ මූලික අදහස වාරිමාර්ග අධ්‍යක්ෂ කෙනඩි විසින් ඉදිරිපත් කිරීමත් සමඟ නැගෙනහිර පළාතේ අම්පාර ප්‍රදේශය නැවත වරක් සංවර්ධනයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්විය. විශේෂයෙන්ම ශ්‍රී ලාංකීය වාරි කර්මාන්ත ඉතිහාසයේ නව පරිච්ඡේදයක් අරඹමින් උස්බිම් ආශ්‍රිත ගැඹුරු ජලාශ ඉදිකර වාරිමාර්ග සඳහා ජලය සැපයීමේ ක්‍රමවේදය යෝජනා කරනු ලැබුවේ ගල්ඔය වාරිමාර්ග සංවර්ධන සැලැස්ම මඟිනි.

ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනයට නව අත්තිවාරමක් පිහිටුවීමට ආධාර වූ කෝල්බෘක් කැමරන් යෝජනා අනුව 1833 දී දිවයින පළාත් පහකට බෙදන ලදී. එහිදී අම්පාර ප්‍රදේශය නැගෙනහිර පළාතට අයත් විය. නැගෙනහිර පළාත ත්‍රීකුණාමලය සහ මඩකලපුව දිස්ත්‍රික්කවලින්ද තමන්කඩුව සහ බින්තැන්න ප්‍රදේශ වලින්ද සමන්විත විය. මෙසේ පිහිට වූ පළාත් නැවත දිස්ත්‍රික්ක වලට බෙදුණි. ඒ අනුව නැගෙනහිර පළාත ත්‍රීකුණාමලය සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක වලින් යුක්ත විය. මඩකලපුව දිස්ත්‍රික්කයට දිගාමඩුල්ල සහ බින්තැන්න ඇතුළත් වේ. 1837 දී බින්තැන්න බදුල්ල දිස්ත්‍රික්කයට යා කරන ලදී. මෙතැන් සිට 1961 දී අම්පාර දිස්ත්‍රික්කය පිහිටුවන තුරු දිගාමඩුල්ල ප්‍රදේශය පාලන බෙදීම් වලට පාත්‍ර නොවුණි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

<u>අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය දැක්ම, මෙහෙවර</u>

<u>ප්‍රකාශය හා අගයන්</u>

දැක්ම

විකසිත ප්‍රජාවකින් හෙබි ඉසුරුපිරි දිස්ත්‍රික්කයක්.

මෙහෙවර

දිස්ත්‍රික්කයේ සම්පත් ප්‍රශස්ත ලෙස යහපාලනමය යාන්ත්‍රණය ඔස්සේ කළමනාකරණය කර නිරසර සංවර්ධනය කරා මෙහෙයවමින් නිදහස් හා සුරක්ෂිත හෘදයාංගම පරිසරයක දැනුමෙන්, නිපුණත්වයෙන්, නිර්මාණශීලීත්වයෙන් හා නිරෝගී බවින් සපිරුණු ඉහළ ජීවන තත්ත්වයෙන් හෙබි, ජනතාවක් සහිත ඉසුරුපිරි දිස්ත්‍රික්කයක් හොඩ නැඟීම.

අපේ අගයන්

- හෘදය සංවේදී රාජ්‍ය සේවක කැළක්.
- සොයා එන හැම දන මන විකසිත වන විශ්වසනීය සේවයක්.
- නව්‍යත්වය සොයමින් සැනෙකින් විසඳුම් සොයා යන කාර්යය සංස්කෘතියක්.
- පිවිතුරු හා හරිත පරිසරයක් තුළින් අවියෝජනීයව අවශ්‍යතාවයන් ඉටු කර ගන්නා වූ ප්‍රසන්න පරිශ්‍රයක්.
- යහපානලමය යොමුවක්

1.3 ප්‍රධාන කාර්යයන්

<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආයතන අංශයේ කාර්ය භාරය.</u>

- කාර්යාලයේ පරිපාලනමය කටයුතු
- ආයතන කාර්යය (ආයතන, නිවාඩු, දුම්රිය බලපත්‍ර ආදිය)
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පරිපාලන කටයුතු හා අධීක්ෂණ කටයුතු
- ග්‍රාම නිලධාරීන්ගේ පරිපාලන කටයුතු
- වී මිල දී ගැනීම් කටයුතු


<u>දිස්ත්‍රික් ලෙක්ම් කාර්යාලයේ ගිණුම් අංශයේ කාර්යය භාරය</u>

- දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශිය ලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල අතර ප්‍රතිපාදන හා අක්මුදල් බෙදා හැරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධ ගිණුම් වාර්තා සකස් කිරීම හා ගණන්දීමේ නිලධාරී වෙත වාර්තා කිරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සියලුම ගෙවීම් කටයුතු

<u>දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පරිපාලනමය හා සම්බන්ධීකරණ අංශවල කාර්යය භාරය</u>

- කාර්යාලයේ පරිපාලනමය කටයුතු
- සමාජසේවා කටයුතු
- සංස්කෘතික හා ආගමික කටයුතු
- මානව සම්පත් සංවර්ධන හා කුසලතා වර්ධන පුහුණු කටයුතු
- උප්පැන්න, මරණ, විවාහ රෙජිස්ට්‍රාර්වරුන් හා හදිසි මරණ පරීක්ෂකවරුන් පත් කිරීම පිළිබඳ කටයුතු
- ජූරි සභික නාමලේඛන සකස් කර අධිකරණයට ඉදිරිපත් කිරීම.
- දිස්ත්‍රික් මට්ටමේ ජාතික උත්සව හා විවිධ වැඩසටහන් සංවිධානය කිරීම.
- මහජන පැමිණිලි සම්බන්ධ කටයුතු
- රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානයන් හරහා සහයෝගය ලබාදීම.
- ආපදා කළමනාකරණ හා සුනාමි නැවත ගොඩනැංවීමේ කටයුතු
- ගිනි අවි හා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර කටයුතු
- සංචාරක නිවාස පිළිබඳ පරිපාලන කටයුතු

1.4 සංවිධාන සටහන - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර



1.5 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා අනුබද්ධිත ආයතන

අම්පාර නගර මධ්‍යයේ සිට කිලෝමීටර් 01ක් පමණ උතුරට බරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිහිටා ඇත. දිස්ත්‍රික්කයේ පරිපාලනට අදාළ විශාල කාර්යය භාරයක් මෙම කාර්යාලය මගින් ඉටු කරනු ලැබේ. දිස්ත්‍රික් කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල ඉතා සවිමත් බවින් යුතු කලුගල් බැම්මෙන් ඉදිකරන ලද හා පැරණි ගොඩනැගිල්ලක් වන අතර එහි පෙෞඩත්වය ගල්ඔය ව්‍යාපාරය හා බැඳි පවතී. බොහෝ දෙනෙකු මෙය හඳුන්වන්නේ අම්පාර කච්චේරිය යන නමිනි. මෙම කච්චේරි පරිශ්‍රය තුළ විවිධ දෙපාර්තමේන්තු කාර්යාල හා විවිධ අංශවලින් සමන්විතය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පාලනය වන ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19ක් හා එක් උප ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ඇත. එම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ග්‍රාම සේවා වසම් 503 ක් අයත් වේ. ඒවා පහතින් දක්වා ඇත

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	ග්‍රාම සේවා වසම් සංඛ්‍යාව	දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සිට ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට ඇති දුර (කි.මී)
1	දෙහිඅත්තකණ්ඩිය	13	121
2	පදියතලාව	20	82
3	මහඔය	17	62
4	උහන	55	11
5	අම්පාර	22	-
6	දමන	33	17
7	ලාහුගල	12	80
8	පොතුවිල්	27	75
9	තිරුක්කෝවිල්	22	42
10	ආලයඩිවෙම්බු	22	28
11	අක්කරපත්තුව	28	28
12	අඩ්ඩාලච්චේන	32	29
13	ඉරක්කාමම්	12	10
14	නින්දවුර්	25	26
15	කාර්තිව්	17	24
16	සායින්දමරුදු	17	25
17	කල්මුණ	29	28
18	කල්මුණ උතුර (උපකාර්යාලය)	29	28
19	නාවිදන්වේලි	20	24
20	සම්මන්තුර	51	20

1.6 අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුව/පළාත් සභාව යටතේ පවතින ආයතන

අනු අංකය	දෙපාර්තමේන්තු කාර්යාල හා විවිධ අංශ
1.	දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලය
2.	සහකාර මැනිවරණ කොමසාරිස් කාර්යාලය
3.	දිස්ත්‍රික් මෝටර් රථ ප්‍රවාහන කාර්යාලය
4.	සමාජ ආරක්ෂක මණ්ඩලයේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය
5.	මිනුම් ඒකක සහ ප්‍රමිති සේවා දෙපාර්තමේන්තුවේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය
6.	දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛන කාර්යාලය.
7.	ආපදා කළමනාකරණ අංශය
8.	දිස්ත්‍රික් ක්‍රීඩා අංශය
9.	නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය
10.	සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය(පළාත්)
11.	දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලය
12.	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය
13.	අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය.
14.	කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවා කාර්යාලය
15.	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අම්පාර දිස්ත්‍රික් කාර්යාලය.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

හිස් වාර්තාවකි.

02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2024 වර්ෂයේ ළඟා කරගත් ඉලක්ක

දිස්ත්‍රික්කය තුළ සංවර්ධන ක්‍රියාකාරකම්

2024 දී ක්‍රියාත්මක වූ ප්‍රධාන සංවර්ධන වැඩසටහන් ලෙස "විමධ්‍යගත අයවැය (DCB) වැඩසටහන සහ ජනාධිපති වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක වූ විශේෂ සංවර්ධන ව්‍යාපෘති වැඩසටහන සඳහන් කළ හැක. අධ්‍යාපනය, සෞඛ්‍යය, ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය, පොදු පහසුකම්, ප්‍රජා සංවර්ධනය යනාදිය සම්බන්ධ උප අංශ 18 ක් යටතේ විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක විය.

මෙම සංවර්ධන වැඩසටහන් යටතේ අවශ්‍ය යටිතල පහසුකම් සලසා දෙමින් සමාජ සුබසාධන සංවර්ධනය සහ පරිසර සංරක්ෂණය සහතික කරමින් ජනතාවගේ ජීවනෝපාය සංවර්ධන කටයුතුවලට සහාය වීම අපේක්ෂා කළ අතර විමධ්‍යගත අයවැය වැඩසටහන දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මෙන්ම කල්මුණ උතුර උප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ද ක්‍රියාත්මක වූ අතර ප්‍රධාන වශයෙන්ම අම්පාර දිස්ත්‍රික්කයේ වෙරළබඩ ප්‍රදේශවල පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජනාධිපති වැය ශීර්ෂය යටතේ විශේෂ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක විය.

කෙසේ වෙතත්, පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් මෙන්ම ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම හේතුවෙන් නියමිත පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සහ අවසන් කිරීමට දැඩි ලෙස බලපෑවේය. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මගපෙන්වීම අනුව අනුමත කරන ලද ව්‍යාපෘති බොහොමයක් නියමිත කාල සීමාව තුළ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ට හැකි විය. තවද, අයහපත් කාලගුණික තත්ත්වය සහ මැතිවරණ දෙකක් පැවැත්වීම හේතුවෙන් ජනාධිපති වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක වූ විශේෂ ව්‍යාපෘතීන් වල ඇතැම් ව්‍යාපෘති අවසන් කිරීමට ප්‍රමාණවත් කාලයක් නොලැබීම හේතුවෙන් අත්හිටුවන ලදී. එබැවින්, ජනාධිපති ලේකම්වරයාගේ 2024.10.28 දිනැති ලිපිය මත පදනම්ව, තවමත් ආරම්භ නොකළ මට්ටමේ ව්‍යාපෘති අත්හිටුවන ලදී.

ඒ අනුව, විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රු. මිලියන 655.42ක් වටිනා ව්‍යාපෘති 1834ක් සහ ජනාධිපති වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘති 385ක් රුමිලියන 408.105ක වියදමින් සාර්ථකව නිම කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හැකිවිය.

තවද, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් දරිද්‍රතා රේඛාවෙන් පහළ පුද්ගලයින්ගේ ආදායම් මට්ටම ඉහළ නංවන අතරම සත්ත්ව පාලන ක්ෂේත්‍රය ඉහළ නැංවීම සඳහා දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල මෙන්ම කල්මුණ උතුර උප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එළු පාලන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ පවුල් 56ක් අතර එළුවන් 168ක් බෙදා දෙන ලදී (ව්‍යාපෘති වටිනාකම රු. මිලියන 5) ව්‍යාපෘතියේ මුළු වියදම රු. මිලියන 4.565 කි.

	ව්‍යාපෘතියේ නම	**වර්ෂය සඳහා මුළු ප්‍රතිපාදනය 2024 (රු. මිලියන)**	**ව්‍යාපෘති සංඛ්‍යාව**	**මුළු වියදම (රු.මිලියන)**
1	විමධ්‍යගත අයවැය වැඩසටහන 001-2-06-023-2509	655.42	1,834	639.51
2	දිස්ත්‍රික් විවිධ සංවර්ධන වැඩසටහන 001-2-06-003-2509	826.21	272	331.69
3	විශේෂ සංවර්ධන වැඩසටහන 001-2-06-022-2509	129	17	17.08
4	තරුණ සහ ක්‍රීඩා සංවර්ධන වැඩසටහන 001-2-06-029-2509	30.30	92	11.46
5	ආගමික හා සංස්කෘතික සංවර්ධන වැඩසටහන්	7.17	19	7.06
6	කඳුකර දශකය	5.00	13	4.897
7	පාසල් ක්‍රීඩා සංවර්ධන	11.119	08	9.38
8	සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන	10.585	05	10.56
9	එළුවන් පාලන ව්‍යාපෘතිය	5.00	56	4.565
10	ONUR ව්‍යාපෘතිය	3.08	01	2.926
11	නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය (රු.මි.0.6)	28.1718	47	122.60
12	නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය (රු.මි.1)	95.904	96	
13	නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය විදුලිය	21.606	463	
14	නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය ජලය	7.08	231	
	එකතුව	**1,835.6458**	**3,154**	**1,161.728**

01. <u>කෘෂි අංශ සංවර්ධනය සහ ආහාර සුරක්ෂිතතාව හා පෝෂණය තහවුරු කිරීම</u>

රටේ පවතින අයහපත් ආර්ථික තත්ත්වය නිසා රැකියා අහිමිවීම, මිල ඉහළ යෑම නිසා මිලදී ගැනීමේ හැකියාව අඩුවීම, සෞඛ්‍ය සම්පන්න ආහාර සොයා ගැනීමට හා පරිභෝජනයට අපහසුතා වැනි දුෂ්කරතා රැසකට ජනතාව මුහුණ දුන්හ. එම දුෂ්කරතා අවම කිරීම සඳහා ගමක සිටින සියලුම පවුල්වලට කුසගින්නේ නොසිටිමින් ශක්තිමත්ව සිටීමට "අලුත් ගමක් – අලුත් රටක්" නමින් විශේෂ වැඩසටහනක් හඳුන්වා දීමට රජය තීරණය කළේය.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයෙන් ලබා දෙන ලද ප්‍රතිපාදන මගින් ක්‍රියාත්මක කළ ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ජීවනෝපාය නඟා සිටුවීමට යොවුන් කෘෂිකර්ම නවීකරණ ගම්මාන වැඩසටහන ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ජීවනෝපාය නඟා සිටුවී විශාල පිටිවහලක් විය.

ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	**ග්‍රාමය**	**ව්‍යාපෘතිය**	**ප්‍රතිපාදනය(රු.)**	**වියදම (රු.)**	**ප්‍රතිලාභීන් සංඛ්‍යාව**
දෙහිඅත්තකණ්ඩිය	උත්තලපුර	අර්ධ තීව්‍ර එළවළු වගාව	1,498,700.00	1,391,311.64	6
		පළතුරු වගාව	3,996,400.00	2,498,239.25	16
දමන	වඩිනාගල	එළුවන් පාලනය	460,925.00	460,925.00	5
		කුකුළු පාලනය	517,575.00	517,575.00	30
එරගම	එරගම 01	එළුවන් පාලනය	1,143,300.00	1,082,884.62	29
		කුකුළු පාලනය	515,000.00	515,000.00	11
		පළතුරු හා එළවළු වගාව	1,285,440.00	980,405.50	50
සම්මන්තුර	මල්වත්ත	පළතුරු හා එළවළු වගාව	520,150.00	520,150.00	10
එකතුව			**9,937,490.00**	**7,966,491.01**	**157**

<u>උපාය මාර්ගික සැලැස්ම යටතේ හදිසි ආධාර ක්‍රියාත්මක කිරීම - SO -1 අම්පාර දිස්ත්‍රික්කයට මෑත කාලීනව බලපෑ ගංවතුරෙන් විපතට පත් පවුල් සඳහා සාමාන්‍ය ආහාර ආධාර - 2024</u>

මෑත කාලීනව අම්පාර දිස්ත්‍රික්කයට බලපෑ ගංවතුර තත්ත්වය හේතුවෙන් පීඩාවට පත් ජනතාව සඳහා හදිසි ආධාර සැපයීම සඳහා ලෝක ආහාර වැඩසටහන සහය දක්වා ඇත.

ලෝක ආහාර වැඩසටහන යටතේ ආහාර සහය වැඩසටහන කාරතීව්, නින්දවූර්, අක්කරපත්තුව, මහඔය, සම්මන්තුර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයන්හි සාර්ථකව ක්‍රියාත්මක විය.

ඒ අනුව පවුල් 10,981ක් තෝරාගෙන ඔවුන්ට සහල් මලු 5,491ක් (එකක් කි.ග්‍රෑ 24ක් බැගින් වන) පරිප්පු මලු 2478ක් (එකක් කි.ග්‍රෑ 20ක් බැගින් වන) සහ පිසින තෙල් බෝතල් 10,981ක් (ලීටර් 1ක් බැගින් වන) ඇතුළත් ලෝක ආහාර වැඩසටහන් ආහාර ආධාර ලබා දෙන ලදී. ලෝක ආහාර වැඩසටහන යටතේ ආධාර සහ බෙදා හැරීමේ වැඩසටහන් වල ප්‍රගතිය පහත පරිදි වේ.

ලෝක ආහාර වැඩසටහන ආහාර සහය වැඩසටහනේ ප්‍රගතිය (2024.12.31 දිනට)

#	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	අනුමත පවුල් ඒකක ගණන	ලැබුණු ආහාර ද්‍රව්‍ය			ගබඩාවල ඉතිරිව ඇති නරක් වූ /හානිවූ ආහාර ද්‍රව්‍ය		
			සහල් (24කි.ග්‍රෑ)	පරිප්පු (20කි. ග්‍රෑ මළු)	තෙල් (ලී. 1 කෑන්)	සහල්	පරිප්පු	තෙල්
1	කාරතිව්	1,979	990	496	1,979	-	-	-
2	නින්දවූර්	2,710	2,294	1,147	4,588	-	-	-
3	අක්කරපත්තුව	4,588	631	316	1,262	-	-	-
4	අම්පාර	442	1,355	678	2,710	-	-	-
5	සම්මන්තුර	1,262	221	111	442	-	-	-
එකතුව		**10,981**	**5,491**	**2,478**	**10,981**	-	-	-

ලෝක ආහාර වැඩසටහන- ආහාර බෙදාහැරීමේ වියදම (2024.12.31 දිනට)

#	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ආහාර සහය වැඩසටහන, ආහාර බෙදා හැරීමේ වියදම (Rs.)
1	කාරතිව්	1,979	374,320.00
2	නින්දවූර්	2,710	279,450.00
3	අක්කරපත්තුව	4,588	602,294.00
4	අම්පාර	442	65,000.00
5	සම්මන්තුර	1,262	260,900.00
	Total	**10,981**	**1,581,964.00**

2024 වර්ෂයේ දී මුහුණ දුන් අභියෝග

2024 වර්ෂයේ ඉලක්ක සපුරා ගැනීමේදී පහත සඳහන් අභියෝගයන්ට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මුහුණ දුන් අතර, එම අභියෝග සාර්ථකව කළමනාකරණය කර ගැනීමට හැකි විය

1. ෆෙන්ගල් සුළි කුණාටුව හා ගංවතුර තත්ත්ව වැනි අහිතකර කාළගුණික තත්ත්වයන්ද ජාතික මට්ටමේ මැතිවරණයන් දෙකක්ද යෙදී තිබීම හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාදයන් සිදුවිය.
2. රටෙහි පවත්නා ආර්ථික තත්ත්වය හේතුවෙන්, ජනාධිපති වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක කිරීමට නිබු එහෙත් වැඩ ආරම්භ නොකළ විශේෂ සංවර්ධන ව්‍යාපෘති අත්හිටුවීමට රජය විසින් තීරණය තීරණය කරන ලදි.
3. ගංවතුර තත්ත්වය තුළ, දිස්ත්‍රික්කයේ ජනතාව ආදායම් මට්ටම අඩුවීම සහ තම දෛනික අවශ්‍යතා සපුරාලීම සඳහා පෝෂ්‍යදායී ආහාර සොයා ගැනීමේ දුෂ්කරතා වැනි දුෂ්කරතා රැසකට මුහුණ දුන්හ. එම නිසා එම අසරණ ජනතාවට අවශ්‍ය ආධාර ලබාදීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මෙන්ම විදේශීය හා දේශීය ආයතන සමඟද සමීපව සම්බන්ධීකරණය කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සිදු විය.

2025 වර්ෂය සඳහා සැලසුම්

දිස්ත්‍රික්කයේ ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය හා පෝෂණය තහවුරු කිරීම, ජීවන තත්ත්වය ඉහළ නැංවීම, ගංවතුර වැනි ස්වභාවික ආපදා තත්ත්ව වලදී පත්වන අපහසුතා පිටු දැකීමට අවශ්‍ය සහය ලබා දීම සහ අඩු ආදායම්ලාභී ජනතාවට සහනදායී ආදායම් මට්ටමක් ළඟා කර ගැනීමට සහය දීම අරමුණු කර ගනිමින් පහත සඳහන් සැලසුම් 2025 වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිතය. ඒ අනුව, 2025 වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සමස්ථ අරමුණ වනුයේ රටේ ආර්ථික සංවර්ධනයට දායක වන අතරම ප්‍රදේශයේ ජනතාවගේ යහපැවැත්ම තහවුරු කිරීමයි.

1. විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රු මිලියන 80 ක ප්‍රතිපාදන යොදවා නිෂ්පාදන ආර්ථිකය ඉලක්ක කරගත් ව්‍යාපෘති සියළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීම.
2. ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධනය ඉලක්ක කර කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත ගෘහස්ථ එළු පාලන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
3. Clean Sri Lanka වැඩසටහන යටතේ විවිධ පාරිසරික, සමාජීය හා ආචාර ධර්ම සංවර්ධන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කිරීම. (බුද්ධංගල කසළ අංගනය පිරිසිදු කිරීම, වෙරළ තීරය පිරිසිදු ප්‍රදේශයක් බවට පත් කිරීම ආදී ලෙස)
4. පෝෂණීය ආහාර සපයා ගැනීමේ අපහසුතාවයෙන් පෙලෙන ජනතාවගේ දෛනික පෝෂණ අවශ්‍යතා සැපයීම සඳහා ආහාර සුරක්ෂිතතා හා පෝෂණ වැඩසටහන් 2025 වර්ෂයේදී තවදුරටත් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.
5. සංචාරක කර්මාන්තය ඉලක්ක කර විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. (blue flag project in pottuvil)

6. යුද්ධයෙන් අවතැන් වූවන් සඳහා නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
7. ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ IRDP හා ප්‍රජා සවිබල ගැන්වීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
8. කෘෂි අංශයේ දිස්ත්‍රික් දායකත්වය ඉහළ නැංවීම සඳහා නවීන කෘෂි තාක්ෂණය භාවිතය, කෘෂි නව්‍යකරණ ව්‍යාපෘතිය (ASMP) ක්‍රියාත්මක කිරීම තුළින් සිදුකිරීමට අපේක්ෂිත වේ.
9. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගීතාවයෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් මඟින් අඩු ආදායම්ලාභී පවුල්, කාන්තාවන් හා තරුණ ප්‍රජාව සවිබල ගැන්වීමට අපේක්ෂිතය.
10. ගොවීන්ගේ අස්වැන්න ආරක්ෂා කිරීමේ අරමුණ හා මිනිස් ජීවිත මෙන්ම අලින්ගේ ජීවිත ද ආරක්ෂා කිරීමේ අරමුණෙන් පවත්නා විදුලි වැටවල් තවදුරටත් පුළුල් කිරීමට අපේක්ෂිතය.
11. දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය අංශයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමට හා අධ්‍යාපන පහසුකම් ඉහළ නැංවීම සඳහා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
12. මුන්දෙණි ආරු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය වෙත අවශ්‍ය සියළු සහයෝගයන් ලබාදීම.
13. ගල්ඔය ගංගාවේ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට වාරිමාර්ග අංශය වෙත අවශ්‍ය සියළු සහයෝගයන් ලබාදීම.
14. අස්වැසුම සමාජ සුබසාධන වැඩසටහන් දිස්ත්‍රික්කය තුළ නියමිත පරිදි ක්‍රියාත්මක කිරීම.
15. ඩී.එස්.සේනානායක සමුද්‍රයේ වාන් බැම්ම කාලය ඉකුත්වීම මත ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වූ ජාතික වැඩ පිළිබඳව සහාය දැක්වීම.



චින්තක අඛේවික්‍රම,
දිසාපති / දිස්ත්‍රික් ලේකම්,
අම්පාර දිස්ත්‍රික්කය.
Email - distsecampara@gmail.com
Fax - 063-2222130

03 පරිච්ඡේදය - 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

1.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒකීය-රුපි

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024		සටහන	2024	2023	
රු.			රු.	රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒකීය-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අයිතම		6,327,349,004	8,048,561,656	ඒකීය-3
-	තැන්පතු		642,099,517	1,136,086,512	ඒකීය-4
-	අත්තිකාරම් ගිණුම්		100,377,774	69,413,731	ඒකීය-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**7,069,826,295**	9,254,061,899	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**7,069,826,295**	9,254,061,899	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		14,481,291	512,000,000	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		7,055,345,004	8,742,061,899	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
1,940,803,049	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රත	5	1,918,341,612	1,286,117,782	
274,759,600	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	235,102,891	230,658,091	ඒකීය-2(ii)
542,760,311	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	540,732,863	3,002,448,094	
-	පොළී ගෙවීම්	8	-	-	
440,400	වෙනත් පුනරාවර්තන වියදම්	9	440,400	3,993,535	
2,758,322,960	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**2,694,617,767**	4,523,217,502	
	මූලධන වියදම්				
50,200,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	44,923,894	23,668,225	
121,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	78,816,549	35,609,488	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒකීය-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
3,300,000	හැකියා වර්ධනය	14	3,182,554	1,392,510	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
175,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**126,922,997**	60,670,223	
	තැන්පතු ගෙවීම්		514,136,116	1,144,057,460	ඒකීය-4
	අත්තිකාරම් ගෙවීම්		178,457,699	68,798,069	ඒකීය-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		692,593,815	1,212,855,529	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		3,514,134,579	5,796,743,254	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		3,541,210,425	2,945,318,645	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		-	-	ඒකීය-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		3,541,210,425		ඒකීය-3
		14	3,541,210,425	-	

ජී.එල්. මහරූෆ්
ප්‍රධාන ගණකාධිකාරී
අමිසාර් දියතුඩාවේ

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒඩිඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තක්සා 2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒඩිඒ-6	10,826,185,165	7,392,945,924
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒඩිඒ-5/5(ඒ)	281,216,669	203,229,604
මුදල් හා මුදල් සමාන දෑ	ඒඩිඒ-3	-	-
මුළු වත්කම්		11,107,401,834	7,596,175,528
ඉදිරි වත්කම් / බැඳීම්			
භාණ්ඩාගාරය වෙත ඉදිරි වත්කම්		81,659,396	131,635,733
දේපළ පිරියත හා උපකරණ සංචිතය		10,826,185,165	7,392,945,924
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒඩිඒ-5(බී)		
ප්‍රාග්ම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒඩිඒ-4	199,557,273	71,593,871
අග්‍රිම ශේෂය	ඒඩිඒ-3	-	-
මුළු වගකීම්		11,107,401,834	7,596,175,528

පිටු අංක 01 සිට 94 දක්වා ඒඩිඒ 1 සිට ඒඩිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 61 සිට 94 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
එස්.ආලෝකඛණ්ඩාර	චින්තක අබේවික්‍රම	ඒ.එල්.මහරුෆ්
ලේකම්	දිස්ත්‍රික් ලේකම් -අම්පාර	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය -අම්පාර
රාජ්‍ය පරිපාලන,පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය		
දිනය :2025/02/	දිනය :2025/02/13	දිනය :2025/02/

එස්. ආලෝකඛණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
අම්පාර දිස්ත්‍රික්කය

ඒ.එල්. මහරුෆ්
ප්‍රධාන ගණකාධිකාරි
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
අම්පාර

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඇමුණුම-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූල්‍ය කඳු ලැබීම්	-	-
ගාස්තු, කොමිසම්, දැඩිමුදල් සහ බදුවලින්	-	-
ලාභ	-	-
අදායම් බෙදාහැරීම් ලැබීම්	-	-
වෙනත් අදායම් කිරීම් වෙනුවෙන් එකතු කරන ලද අදායම්	220,642,384	735,842,291
ලබාදීම් ලැබීම්	6,327,495,277	8,045,561,656
ආනයනයන් වෙනුවෙ ගෙවීම්	105,380,803	91,018,522
තැන්පතු ලැබීම්	642,099,517	1,136,086,512
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**7,295,617,981**	**10,011,508,981**
අඩුකළා : මුදල් බාහිර කිරීම්		
මුද්‍රාලද වේතන හා මෙහෙයුම් වියදම්	2,143,127,579	1,509,011,478
සේවකයන්ට සහ බිහිකිරීම්	540,732,863	5,006,441,629
වෙනත් බාහිර කිරීම් වෙනුවෙන් ගෙවා ලද වියදම්	5,832,069,078	3,683,786,208
භාණ්ඩාගාරයට බිහිවෙන ලද ලාභ	14,481,291	512,000,000
අත්තිකාරම් ගෙවීම්	124,148,057	95,541,984
තැන්පතු ගෙවීම්	514,136,116	1,144,057,460
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා බාහිර කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**7,168,694,984**	**9,950,838,759**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**126,922,997**	**60,670,223**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
ණයකි	-	-
ලාභාංශ	-	-
නිවේශයේ ඉවත්වීමේ ප්‍රතිඵලයක් හා සහගත වන්නෙකි විකිණීම්	-	-
දේපළ අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	
අඩුකළා : මුදල් බාහිර කිරීම්		
සහගත වන්නෙකි ඉදිකිරීම් සහ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	126,922,997	60,670,223
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා බාහිර කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**126,922,997**	**60,670,223**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(126,922,997)**	**(60,670,223)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	0	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දැරිය යුතු ලැබීම්	-	-
විදේශීය ණය ලැබීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)	-	-
අඩුකළා : මුදල් බාහිර කිරීම්		
දැරිය යුතු ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා බාහිර කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ)-(ඌ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ) .	-	-
වර්ෂයේ 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

1

ඒ.එල්. මහරූෆ්
ප්‍රධාන ගණකාධිකාරී
අම්පාර දිස්ත්‍රික් වෙතුවට

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

ඒඩිල් - 1

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය

ආදායම් ගණන් දීමේ නිලධාරි : දිස්ත්‍රික් ලේකම්

වියදම් ශීර්ෂ අංකය : 270

රු.

ආදායම් සංකේතය	ආදායම් විස්තරය	සටහන	ආදායම් ඇස්තමේන්තුව (1)		ආදායම් රැස්කිරීම (2)			(3)	ආදායමෙන් ආපසු ගෙවීම් (4)			(5)
			මූලික ඇස්තමේන්තුව	සංශෝධිත ඇස්තමේන්තුව	අදාළ අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව විසින් රැස්කිරීම	වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම (SA-21)	එකතුව	ඉහළ ආදායම් රැස්කිරීම	මුදලින්	වැරදි නිවැරදි කිරීම	එකතුව	ශුද්ධ ආදායම
			1(i)	1(ii)	2(i)	2(ii)	2(iii)=2(i) +2(ii)	(3)	4(i)	4(ii)	4(iii)=4(i)+ 4(ii)	5=2(iii)+(3)-4(iii)
		1	අදාල නොවේ.									

2025.02.13
දිනය

ප්‍රධාන ගණකාධිකාරි
ඒ.එල්.මහරුෆ්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය-අම්පාර

ඒ.එල්. මහරුෆ්
ප්‍රධාන ගණකාධිකාරි
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
අම්පාර

.....

ආදායම් ගණන්දීමේ නිලධාරි
චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම් -අම්පාර

චින්තක අබේවික්‍රම
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
අම්පාර දිස්ත්‍රික්කය

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය :270 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : අම්පාර

රු.

වැය විෂයය	සටහන	ප්‍රතිපාදනය					වියදම			ශුද්ධ බලපෑම		
		මූල්‍ය කරණ සංකේත අංකය	වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරු කිරීම් (3) (-)/+	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුදල් පොතට අනුව වියදම (5)	මු.රෙ. 208 යටතේ අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් (භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව) (6)	මුළු වියදම (7)= (5)+(6)	ඉතිරිය / (ඉක්මවීම්) (8)=(4)-(7)	ඉතිරිය / (ඉක්මවීම්) සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස (9)=(8)/(4)*100	වෙනස්කම්වලට හේතු
පුනරාවර්තන වියදම්												
වැඩසටහන (1)												
වැඩසට./ව්‍යාපෘ./උප ව්‍යාපෘ./වැය විෂයය අංකය												
වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5											
පුද්ගල පඩිනඩි												
1001 වැටුප් හා වේතන		11	1,139,000,000		(9,841,951)	1,129,158,049	1,109,496,781		1,109,496,781	19,661,268	2	අනියම් ඉතිරිකිරීම්
1002 අතිකාල හා නිවාඩු දින වැටුප්		11	50,100,000		2,500,000	52,600,000	50,608,773		50,608,773	1,991,227	4	වියදම් පාලනය කිරීම
1003 වෙනත් දීමනා		11	555,500,000	197,970,000	5,575,000	759,045,000	747,478,733	10,757,325	758,236,058	808,942	0	වියදම් පාලනය කිරීම
එකතුව			**1,744,600,000**	**197,970,000**	**(1,766,951)**	**1,940,803,049**	**1,907,584,287**	**10,757,325**	**1,918,341,612**	**22,461,436**		
වැය විෂය අනුව වර්ගීකරණය කරන ලද අනෙකුත් භාණ්ඩ හා සේවා	6											
ගමන් වියදම්												
1101 දේශීය		11	24,800,000		2,950,000	27,750,000	26,119,092		26,119,092	1,630,908	6	වියදම් පාලනය කිරීම
7	මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය -102	පුනරාවර්තන	1,496,411,100.00	1,496,411,100.00	1,418,205,979.74	94.77
8	ආරක්ෂක අමාත්‍යාංශය - ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය -103	පුනරාවර්තන	74,839,314.97	74,839,314.97	68,573,719.13	91.63
9		ප්‍රාග්ධන	34,725,759.45	34,725,759.45	28,252,425.56	81.36
10	අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය -110	පුනරාවර්තන	15,047,745.16	15,047,745.16	12,527,588.49	83.25
11		ප්‍රාග්ධන	7,653,339.58	7,653,339.58	7,468,708.16	97.59
12	සෞඛ්‍ය අමාත්‍යාංශය - දේශීය වෛද්‍ය අංශය -111	පුනරාවර්තන	15,331,415.75	15,331,415.75	13,268,679.46	86.55
13		ප්‍රාග්ධන	52,000.00	52,000.00	52,000.00	100.00
14	කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය - කෘෂිකර්ම අංශය -118	පුනරාවර්තන	32,494,756.00	32,494,756.00	31,958,805.58	98.35
15		ප්‍රාග්ධන	34,130,286.00	34,130,286.00	19,639,662.39	57.54
16	බලශක්ති අමාත්‍යාංශය -119	පුනරාවර්තන	202,080.00	202,080.00	202,080.00	100.00
17	කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය - ඉඩම් අංශය -122	පුනරාවර්තන	11,412,559.23	11,412,559.23	11,110,402.35	97.35
18		ප්‍රාග්ධන	14,988,701.55	14,988,701.55	5,361,201.55	35.77
19	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය - 123	ප්‍රාග්ධන	194,455,404.46	194,455,404.46	190,560,466.25	98.00
20	අධ්‍යාපන, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය -126	පුනරාවර්තන	948,650.00	948,650.00	876,399.90	92.38
21		ප්‍රාග්ධන	2,670,000.00	2,670,000.00	2,627,612.82	98.41

22	රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - 130	පුනරාවර්තන	133,584,535.99	133,584,535.99	122,698,361.19	91.85
23		ප්‍රාග්ධන	1,236,100.00	1,236,100.00	1,136,785.00	91.97
24	විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය -149	පුනරාවර්තන	3,034,923.08	3,034,923.08	2,536,048.65	83.56
25		ප්‍රාග්ධන	6,877,041.47	6,877,041.47	6,429,568.16	93.49
26	පරිසර අමාත්‍යාංශය -160	පුනරාවර්තන	19,925,480.00	19,925,480.00	19,156,649.57	96.14
27		ප්‍රාග්ධන	205,000.00	205,000.00	194,050.00	94.66
28	ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය -166	ප්‍රාග්ධන	4,500,000.00	4,500,000.00	4,500,000.00	100.00
29	කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය -171	පුනරාවර්තන	544,000,225.97	544,000,225.97	531,518,314.56	97.71
30		ප්‍රාග්ධන	12,296,307.06	12,296,307.06	12,271,469.00	99.80
31	මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය -187	පුනරාවර්තන	18,170,966.97	18,170,966.97	16,350,532.78	89.98
32	මහජන ආරක්ෂක අමාත්‍යාංශය -189	පුනරාවර්තන	321,980.00	321,980.00	289,101.00	89.79
33	අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය - විදේශ රැකියා අංශය- 193	පුනරාවර්තන	1,572,000.00	1,572,000.00	1,422,358.26	90.48
34		ප්‍රාග්ධන	1,818,950.00	1,818,950.00	1,813,767.39	99.72
35	ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය -193	පුනරාවර්තන	1,001,650.00	1,001,650.00	913,542.29	91.20
36		ප්‍රාග්ධන	50,550.00	50,550.00	50,550.00	100.00
37	ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය- 194	පුනරාවර්තන	2,157,751.42	2,157,751.42	1,591,722.41	73.77
38		ප්‍රාග්ධන	20,339,609.87	20,339,609.87	18,090,907.51	88.94
39	වාරිමාර්ග අමාත්‍යාංශය - වාරිමාර්ග කළමනාකරණ අංශය -198	පුනරාවර්තන	4,789,079.00	4,789,079.00	3,898,665.08	81.41
40		ප්‍රාග්ධන	1,241,519.00	1,241,519.00	1,196,384.00	96.36
41	බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව -201	පුනරාවර්තන	10,389,579.00	10,389,579.00	9,987,028.65	96.13
42		ප්‍රාග්ධන	2,518,440.00	2,518,440.00	2,490,714.45	98.90
43	මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව -202	පුනරාවර්තන	45,000.00	45,000.00	34,980.00	77.73
44		ප්‍රාග්ධන	411,764.00	411,764.00	411,764.00	100.00
45	සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව -206	පුනරාවර්තන	3,068,500.00	3,068,500.00	2,958,441.45	96.41
46	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව -210	පුනරාවර්තන	84,018.66	84,018.66	52,373.66	62.34
47	සමාජ සේවා දෙපාර්තමේන්තුව -216	පුනරාවර්තන	27,141,025.50	27,141,025.50	27,019,189.43	99.55
48		ප්‍රාග්ධන	207,860.00	207,860.00	206,810.00	99.49
49	පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව - 217	පුනරාවර්තන	593,000.00	593,000.00	566,779.48	95.58
50		ප්‍රාග්ධන	2,226,200.00	2,226,200.00	2,217,120.00	99.59
51	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව -219	පුනරාවර්තන	310,200.50	310,200.50	268,181.00	86.45

52	ආගමන හා විගමන දෙපාර්තමේන්තුව- 226	පුනරාවර්තන	25,740.00	25,740.00	25,740.00	100.00
53	පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව - 227	පුනරාවර්තන	29,791,249.68	29,791,249.68	29,159,496.95	97.88
54	ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව -252	පුනරාවර්තන	2,394,101.00	2,394,101.00	2,173,576.49	90.79
55		ප්‍රාග්ධන	31,384,766.55	31,384,766.55	30,442,169.97	97.00
56	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව -253	පුනරාවර්තන	24,045,993.31	24,045,993.31	23,596,619.93	98.13
57	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව -284	පුනරාවර්තන	37,545,059.00	37,545,059.00	37,471,158.52	99.80
58	ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව -286	පුනරාවර්තන	51,593,565.00	51,593,565.00	45,602,349.43	88.39
59		ප්‍රාග්ධන	1,554,615.00	1,554,615.00	1,279,923.75	82.33
60	ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව -290	ප්‍රාග්ධන	485,000.00	485,000.00	445,784.38	91.91
61	ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව -300	පුනරාවර්තන	1,317,000.00	1,317,000.00	1,040,974.67	79.04
62	ජේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව -303	පුනරාවර්තන	912,000.00	912,000.00	596,500.00	65.41
63	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව -307	පුනරාවර්තන	2,254,107.60	2,254,107.60	1,773,817.75	78.69
64	ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව -326	පුනරාවර්තන	1,753,000.00	1,753,000.00	1,356,535.10	77.38
65	ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව -327	පුනරාවර්තන	1,055,464.70	1,055,464.70	1,002,561.89	94.99
66		ප්‍රාග්ධන	1,791,000.00	1,791,000.00	1,756,990.50	98.10
67	මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව - 328	පුනරාවර්තන	1,010,600.00	1,010,600.00	872,732.00	86.36
68		ප්‍රාග්ධන	1,236,715.00	1,236,715.00	1,197,452.00	96.83
මුළු එකතුව			**4,094,347,749.23**	**4,094,347,749.23**	**3,832,069,077.29**	**93.59**

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	2,933,540,557	2,933,540,557	-	100%
9152	යන්ත්‍රෝපකරණ	4,085,464,611	4,085,464,611	-	100%
9153	ඉඩම්	3,310,058,000	3,310,058,000	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	497,121,998	497,121,998	-	100%
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE



මගේ අංකය / எனது இல. / My No. EPCG/AM/A/Dist.Sec./02/2024/02 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 මැයි 29 දින

දිසාපති කාර්යාලය
30 MAY 2025
අම්පාර

නිශ්චිත අංශය
31 MAY 2025
දිසාපති කාර්යාලය අම්පාර

දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අම්පාර.

ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යටෝක්ත විගණන වාර්තාව මේ සමඟ එවා ඇත.

එම්.එච්.එම්. අරෂාත්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත :- අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. EPCG/AM/A/Dist.Sec./02/2024/02 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 මැයි 29 දින.

ගණන්දීමේ නිලධාරී,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අම්පාර.

ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 28 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍ය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍ය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්

ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයන්, ව්‍යාජ ලේඛන සෑකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 ආදායම් නොවන ලැබීම්

(අ) සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ (ACA-F) භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු.6,327,349,004 ක් වන නමුත් මූදල් ප්‍රවාහ ප්‍රකාශනයේ (ACA-C) අග්‍රිම ලැබීම් රු.6,327,495,277 වන නිසා මූදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ලැබීම් රු.146,273 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) වාර්ෂික අග්‍රිම ගිණුම් සාරාංශ ප්‍රකාශනයෙහි භාණ්ඩාගාරයට පියවන අග්‍රිමය ලෙස රු.4,481,291 ක් දක්වා තිබූ නමුත් අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනයෙහි භාණ්ඩාගාරයට පියවන අග්‍රිමය රු.14,481,291 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනයෙහි (ACA - 3) අග්‍රිම පියවීම් රු.10,000,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

1.5.2 අත්තිකාරම් ගෙවීම්

2024 වර්ෂයේ අත්තිකාරම් අයකර ගැනීම් ලෙස ACA (F) කාර්යසාධන වාර්තාවේ රු.100,377,774 ක් පෙන්වන නමුත් අත්තිකාරම් ගිණුමේ ආකෘති අංක 05 අනුව රු.100,231,501 ක් ලෙස දැක්වේ. ඒ අනුව කාර්යසාධන වාර්තාවේ අත්තිකාරම් අයකර ගැනීම් රු.146,273 ක් වැඩියෙන් පෙන්නුම් කරයි.

1.5.3 මූල්‍ය නොවන වත්කම්

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් කාන්තා සංවර්ධන මධ්‍යස්ථානයේ සහ කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයේ ඉඩම්, ගොඩනැඟිලි සහ ඉන්වෙන්ටරි ද්‍රව්‍ය නක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දමන, අඩාලවිවානේ, තිරුක්කෝවිල් යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ඉඩම් ද පදියතලාව හා දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දෙකට අයත් නිල නිවාස හා රජයේ නිවාස ද තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2017 හා 2018 වර්ෂයන්හි දී ඉදිකරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්යාශ පහළොවකට අයත් නිල සෙවණ ගොඩනැගිලි වටිනාකම් රු.46,422,256ක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළව මූල්‍ය නොවන වත්කම් සාරාංශයට (SA80) අනුව එක් එක් වත්කම් අයිතමවලට අදාළව ඉදිරිපත් කරන ලද හර කිරීම්, භාණ්ඩාගාර සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවෙහි (SA82) සමාලෝචිත වර්ෂය තුළ හර කිරීම් සහ භාණ්ඩාගාර ශේෂ පිරික්සුම් අනුව හර කිරීම් අනුව පහත නොසැසඳීම් පැවතුණි.

සංකේත අංකය	SA80 අනුව ශේෂය	SA82 අනුව ශේෂය	SA21 අනුව ශේෂය
	රු.	රු.	රු.
9151	1,123,264,115	1,794,275	46,892,566
9152	684,376,370	32,722,514	32,529,591
9153	1,438,249,000	–	–
9160	194,250,061	110,708,868	57,505,288
	3,440,139,546	**145,225,657**	**136,927,445**

(ඉ) මූල්‍ය නොවන වත්කම් සාරාංශයෙහි (SA80) 9152 වත්කම් අයිතමය යටතේ සමාලෝචිත වර්ෂය තුළ හර කිරීම් රු.684,376,370 ක් ලෙස දක්වා තිබුණ ද භාණ්ඩාගාර මුද්‍රිතවල වත්කම් මාසික සාරාංශ සටහන් අනුව රු.688,888,972 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් සාරාංශයෙහි සමාලෝචිත වර්ෂය තුළ හර කිරීම් රු.4,512,602 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමුච්චිත මූල්‍ය නොවන වත්කම් වාර්තාව (SA82) අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට කෙරිගෙන යන වැඩ යටතේ රු.7,990,518 ක් වටිනා රජයේ නිවාස හා සංචාරක නිවාස ද රු.28,500,000 ක් වටිනා කාගෝ වාහන ලෙස එකතුව රු.36,490,518 ක් පවතින බව දක්වා තිබුණ ද හෙතිකව එවැනි කෙරිගෙන යන වැඩක් හෝ කාගෝ වාහන ද නොපවතින බව නිරීක්ෂණය විය.

(උ) සමාලෝචිත වර්ෂය ආරම්භක දිනට මූල්‍ය නොවන වත්කම් ගිණුම් සාරාංශ වාර්තාවෙහි (SA80) වත්කම් අයිතම හතරකට අදාළ ආරම්භක ශේෂය රු.7,392,945,922 ක් වුවද සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවේ (SA82) තුළ එම වත්කම් අයිතම හතරට අදාළ ආරම්භක ශේෂය රු.10,677,482,178 කි. ඒ අනුව වාර්තා දෙකෙහි මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂයන් අතර රු.3,284,536,256 ක වෙනස්කමක් පැවතුණි.

(ඌ) මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂය තුළ දී මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකම රු.78,816,549 ක් වුවද භාණ්ඩාගාර පොත් අනුව සමුච්චිත මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවේ (SA82) එය රු.145,2254,657 ක් වූයෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා භාණ්ඩාගාර පොත් අතර මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වටිනාකමෙහි රු.66,409,108 ක වෙනසක් පැවතුණි.

1.5.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම් ලෙස රු.78,816,549 ක් දක්වා තිබූ නමුත් එය තහවුරු කර ගැනීම සඳහා විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවුණි.

(ආ) මහඔය සමෘද්ධි බැංකුවේ මුදල් අයකැමි සතුව තිබූ මුදල් හෙතිකව පරීක්ෂා කිරීමේ දී රු.754,143 ක මුදලක් තිබූ අතර එදිනට ලබාගත් මුදල් සහතිකයේ ද එම වටිනාකම ම සටහන් වී තිබූ නමුත් ශේෂ පරීක්ෂණයේ මුදල් වටිනාකම ලෙස රු.5,798,792 ක බැර අගයක් පෙන්වූ අතර මෙම වෙනසට හේතුව තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

1.5.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමපාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

ලේඛනය වර්ගය	අදාල රෙගුලාසිය	නිරීක්ෂණය
ඇප ලේඛනය	මූදල් රෙගුලාසි 891(1)	යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.4 (ආ)	දමන, අඩ්ඩාලච්චෙන, තිරුක්කෝවිල් යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් ඉඩම් ද පදියතලාව හා දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකට අයත් නිල නිවාස හා රජයේ නිවාස ද නක්ශේරු කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.	1.5.3 (ආ)
1.6.4 (ඇ)	2017 හා 2018 වර්ෂයන්හි දී ඉදිකරන ලද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහළොවකට අයත් නිල සෙවණ ගොඩනැගිලි වටිනාකම රු.46,422,256ක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි.	1.5.3 (ඇ)
1.6.4 (ඇ)	සමුච්චිත මූල්‍ය නොවන වත්කම් වාර්තාව (SA82) අනුව සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට කෙරීගෙන යන වැඩ යටතේ රු.7,130,174ක් වටිනා රජයේ නිවාස හා සංචාරක නිවාස ද රු.28,500,000ක් වටිනා කාගෝ වාහන ලෙස එකතුව රු.35,630,174ක් පවතින බව දක්වා තිබුණ ද හෙතිකව එවැනි කෙරීගෙන යන වැඩක් හෝ කාගෝ වාහන ද නොපවතින බව නිරීක්ෂණය විය.	1.5.3 (ඊ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 09 ක් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වැය විෂයන් 12 කට අදාළව ලැබී තිබූ රු.54,296,905 ක ප්‍රතිපාදනවලින් සියයට 25 සිට සියයට 49 දක්වා ප්‍රමාණයක් උපයෝජනය කර නොතිබුණි.

3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

(අ) කෘෂිකර්ම අමාත්‍යාංශය

කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අංක MOA&/PI/RED/DP/06/GOAT/01(2024) හා 2024 පෙබරවාරි 28 දිනැති ලිපිය සහ අමුපාර දිස්ත්‍රික් ලේකම්ගේ අංක PLN/10/REDMA/2024/01 හා 2024 මැයි 30 දිනැති ලිපිය අනුව අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් පවුල් 03 කට රු.85,000 ක් වටිනා එළුවන් තිදෙනෙකු බැගින් ලබා දී තිබූ නමුත් අක්කරපත්තුව - 06 හි පදිංචි ප්‍රතිලාභියෙකු වෙත ලබා දුන් එළුවන් තිදෙනා 2024 නොවැම්බර් 20 වන දින ඇති වූ ගංවතුර තත්ත්වය හේතුවෙන් අතුරුදහන් ඇති අතර ඒ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයෙන් මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2015 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා රු.42,000,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණ ද 2021 වර්ෂය වන විට රු.16,695,573 ක් වියදම් කරමින් ඉදිකර තිබුණු එම ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දමා තිබුණි. නැවත 2024 වර්ෂයේ රු.12,870,964 ක් වටිනාකමැති ඉදිකිරීම් සිදුකර තිබුණ ද ආරම්භයේ සිට වසර 10 ක් පමණ ගත වී ඇතත් ව්‍යාපෘතියේ වැඩ අවසන් කර නොතිබුණි.

(ඇ) වැඩහිටි ආධාර ලබාදීම

(i) සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ 2018 ඔක්තෝබර් 15 දිනැති චක්‍රලේඛ අංක NSE/EL/01/2018 හි 2.14 වගන්තිය ප්‍රකාරව ප්‍රමාද ගෙවීම් සඳහා විධිවිධාන සලසා තිබියදී උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.2,707,900 ක මුළු වැඩහිටි දීමනාවක් වැඩහිටියන් 792 දෙනෙකු හට ගෙවා නොමැති අතර 2024 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ එම මුදල් නැවත අමාත්‍යාංශය වෙත යවා තිබුණි.

(ii) සමාජ සුභසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයේ 2018 ඔක්තෝබර් 15 දිනැති වක්‍රලේඛ අංක NSE/EL/01/2018 හි 2.15 වගන්තිය ප්‍රකාරව අඛණ්ඩව මාස 03 ක කාලයක් වැඩිහිටි දීමනාව ලබා නොගන්නා ප්‍රතිලාභීන්ගේ නම් කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පොරොත්තු ලේඛනයේ සිටින ඊළඟ ප්‍රතිලාභියා හට එම දීමනාව ලබා ගැනීමේ අවස්ථාව සලසා දිය යුතු වුවද උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එසේ කටයුතු කර නොතිබුණි.

(ඇ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

(i) මහඔය හා අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීමේ දී 2024 වර්ෂය තුළ ප්‍රතිලාභීන් මිය යාම හේතුවෙන් විශ්‍රාම වැටුප් ගෙවීම් නතර කිරීමේ දී නියමිත දිනට ගෙවීම් නතර නොකිරීම හේතුවෙන් රු.16,254 ක් එම ප්‍රතිලාභීන්ගේ නමින් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) විශ්‍රාම වැටුප් දීමනා ගෙවීම් සම්බන්ධව නිසි ලෙස ගණනය කිරීම් සිදු නොකිරීම හේතුවෙන් උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභීන් 37 දෙනෙකු හට රු.2,026,913 ක විශ්‍රාම වැටුප් දීමනා අතිරික්තයක් ගෙවා තිබුණි.

(ඉ) කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය

(i) ග්‍රාම ශක්ති වැඩසටහන

(a) ග්‍රාම ශක්ති වැඩසටහන 2018 සිට 2023 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ ග්‍රාම ශක්ති සමිති සාමාජිකයන් වෙත ලබා දෙන ලද රු.183,669,297 ක ණය මුදලකින් රු.49,796,356 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගත යුතුව පැවතුණි.

(b) ඉහත වැඩසටහන සම්බන්ධයෙන් සෞභාග්‍ය සංවර්ධන කාර්යාංශය මගින් නිකුත් කරන ලද අංක SDB/SPV/GS/2022/වක්‍රලේඛ 01 හා 2022 ජූනි 28 දිනැති වක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාත්මක පවතින ග්‍රාම ශක්ති මට්ට සමිතිවල පවතින මුදල් උපයෝගී කර ගනිමින් ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන් සඳහා, අත්‍යවශ්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සහ සමිති සාමාජිකයන් සඳහා අත්‍යවශ්‍ය අනෙකුත් වැඩසටහන් සඳහා වන ව්‍යාපෘති සඳහා යොදාගත හැකි වුවද අමාත්‍ය දිස්ත්‍රික්කය තුළ ලියාපදිංචි සමිති 244 අතරින් ක්‍රියාත්මක පවතින සමිති 136 ක් වක්‍රලේඛය අනුව තම අරමුදල් භාවිතා නොකර තම බැංකු ගිණුම්වල එකතුව රු.29,375,289 ක මුදලක් නිෂ්ක්‍රීයව රඳවාගෙන තිබෙන බව නිරීක්ෂණය වූ අතර

ලියාපදිංචි මුළු සමිති අතරින් 2024 වර්ෂය වන විට අක්‍රිය සමිති 108 ක ඔවුන්ගේ බැංකු ගිණුම් තුළ රු.8,457,904 ක මුදලක් රඳවාගෙන තිබෙන බව ද නිරීක්ෂණය විය.

(ii) කාන්තා කාර්යාංශය

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය මඟින් අඩු ආදායම්ලාභී වැන්දඹු හා ගෘහ මූලික කාන්තාවන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම සඳහා අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක් තුළ 2010 සිට 2022 කාලපරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කරන ලද ණය ව්‍යාපෘති 05 ක් යටතේ පුද්ගලයින් 24 දෙනෙකුට අදාළව රු.99,496 ක් අය කර ගත යුතුව පැවතුණි.

(ඊ) මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අස්වැසුම් සුබසාධක ප්‍රතිලාභ

මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ඇති සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් 2023 ජූලි 13 වන දින නිකුත් කර ඇති අංක MF/WBB/02NOTICE/D/DIV-2022 දරන ලිපිය මඟින් දක්වා ඇති පරිදි එක් ප්‍රතිලාභියෙකු පමණක් සිටින පවුලක එම ප්‍රතිලාභියා මියගිය හොත් ග්‍රාම නිලධාරී විසින් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය වෙත දන්වා එම ප්‍රතිලාභියාගේ ගෙවීම් නතර කළ යුතු වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක අස්වැසුම සුබසාධක ප්‍රතිලාභීන් 23 දෙනෙකුගේ ගිණුම්වලට ඔවුන් මිය යාමෙන් පසුව ද මුදල් බැරකර තිබුණි. ඒ අනුව අදාළ වසම්වල ග්‍රාම නිලධාරීවරුන්ගේ රාජකාරිය නිසි පරිදි ඉටු නොවීම හේතුවෙන් රජයට අමතර වියදමක් ලෙස රු.825,250 ක මුදලක් දැරීමට සිදු වී තිබුණි.

3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම	අනුකූල නොවීම
	රු.	
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය		
XXIV පරිච්ඡේදයේ 4 වගන්ති	1,024,622	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය අනුව, සේවය අත්හිට වූ, සේවය අත්හැර ගිය, රෝගී සහ විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් වර්ෂ 01 සිට වර්ෂ 10 ක කාල පරාසයක සිට හිඟ ණය අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.
(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ		
(i) 2001 අගෝස්තු 22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2001	–	එක් සේවා ස්ථානයක සේවය කළ යුතු උපරිම සේවා කාලය වසර පහක් සහ වසර පහ ඉක්මවා එක් සේවා ස්ථානයක සේවය කර ඇති සෑම නිලධාරියෙකුම වෙනත් සේවා ස්ථානයකට මාරු කළ යුතු වුවත් දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරන නිලධාරීන් 26 දෙනෙකු වසර 05 සිට වසර 15 දක්වා කාලයක් එකම සේවා ස්ථානයක සේවයේ නියුතුව සිටින අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඔවුන් වෙනත් සේවා ස්ථානයකට මාරු කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii)	රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2009 අප්‍රේල් 16 දිනැති හා අංක 2009/09 චක්‍රලේඛයේ 2.iv වගන්තිය සහ ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 (2.2) වගන්තිය	1,466,674	වේලාව පදනම් කරගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කරගන්නේ නම්, එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් සනාථ කළ යුතු වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක මාණ්ඩලික නිලධාරීන් නිදෙනෙකු හට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කිරීමකින් තොරව වැටුප් ලබා දී තිබුණි.
(iii)	රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 2009 අප්‍රේල් 16, 2009 ජුනි 17 සහ 2023 මැයි 12 දිනැති රජයේ චක්‍රලේඛ අංක 09/2009, 09/2009(i) සහ 02/2021(viii)	1,900,943	වේලාව පදනම් කරගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කරගන්නේ නම්, එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍රය මඟින් සනාථ කළ යුතු වුවද 2024 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ පොතුවිල්, සයින්දමරුදු, ඉරක්කාමම්, කල්මුණ සහ අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මාණ්ඩලික නිලධාරීන් 19 දෙනෙකු හට ඇඟිලි සලකුණු තහවුරු ලබා ගැනීමකින් තොරව නිවාඩු දින දීමනා ගෙවීම් කර තිබුණි.
(ඇ)	1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 454 පරිච්ඡේදයේ 191 වගන්තිය	–	රජයේ ඉඩමක් පුද්ගලයෙකුට, පුද්ගල කණ්ඩායමකට වාණිජමය අරමුණක් සඳහා ලබාදෙන විට ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ අවසර ලබා ගත යුතු බව සඳහන් කර ඇති නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ දිගු කාලීන බදු අවසරයකින් තොරව පෞද්ගලික සමාගම් 14 ක් වෙත ලබා දී තිබුණි.

3.5 කැන්පතු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සහ අඩඩාලවිවෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව කැන්පත් කර වසර 02 ක් ඉක්මවා ඇති රු.197,850 ක් වටිනා කැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

(අ) ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පානම බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ රු.2,910,000 ක් වැයකර බොරලු යොදා ඉදිකර තිබූ කෘෂි මාර්ගය නිසි ශක්‍යතා අධ්‍යනයකින් තොරව ඉදිකිරීම නිසා වැසි සමයේ දී ඇති වූ ගංවතුර තත්ත්වය හේතුවෙන් බාදනයට ලක්ව හානි වී තිබුණි.

(ආ) මහඔය ප්‍රාදේශීය කාර්යාලය විසින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ 2009 ට පෙර ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන් වූ, සාමාජිකයින් 03 දෙනෙකුට වැඩි පවුල් සඳහා නිවාස ව්‍යාපෘතියේ ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘති ගනුදෙනු සඳහා නව බැංකු ගිණුමක් පවත්වා නොගැනීම නිසා එක් ප්‍රතිලාභියෙකු වෙත ව්‍යාපෘතිය වෙනුවෙන් ලද මුදලින් පෞද්ගලික ණය වාරික හා පොලිය ලෙස රු.91,551 ක් ගෙවීම සිදුකර තිබුණි.

(ඇ) ජනාධිපති අරමුදල යටතේ අඩඩාලවිවෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අඩඩාලවිවෙන 07 ග්‍රාම නිලධාරී වසමෙහි ළමා ක්‍රීඩා පිටියක් හා වෙරළ උද්‍යානයක් පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.2,925,000 ක් වැයකර සෙල්ලම් උපකරණ (REVOLI) සවිකර තිබුණි. 2023 දෙසැම්බර් 19 දිනැති මුදල් අමාත්‍යාංශයේ වක්‍රලේඛ MF/02/2023 හි 1.11 වගන්තිය ප්‍රකාරව ඉදිකිරීම් යෝජිත අරමුණු සඳහා අනාගතයේදී බාධාවකින් තොරව යොදාගත හැකි බව හා නඩත්තු සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර ඇති බවට ප්‍රාදේශීය ලේකම් විසින් සෑහීමකට පත් විය යුතු වුවත් වසර 05 ක වගකීම් සහිත මෙම උපකරණ මිලදීගෙන මාස 06 ක් ඉක්ම වීමටත් පෙර කැඩී පිපිරී පළුදු වී තිබූ නමුත් ප්‍රාදේශීය ලේකම් විසින් ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

4.1.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

(අ) කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශයේ තරුණ කෘෂි ව්‍යවසායකත්ව ගම්මාන වැඩසටහන - 2024 යටතේ දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වඩිනාගල ගම්මානයේ ගොවීන් වෙනුවෙන් රු.4,967,175 ක අරමුදලක් ලබා දී තිබුණු නමුත් දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අඩඩාලවිවෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත කොට්ඨාශයේ පාසලක් සඳහා ඉඩමක් අත්පත් කර ගැනීම වෙනුවෙන් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබූ රු.6,500,000 ක් අදාළ කාර්යය සඳහා උපයෝජනය නොකර තැන්පත් ගිණුමෙහි වර්ෂ 06 ක කාලයක සිට රඳවාගෙන තිබුණි.

(ඇ) විමධ්‍යගත අයවැය වැඩසටහන - 2024 යටතේ අඩඩාලවිවෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අල්/ සඟීරා විද්‍යාලයේ පන්ති කාමර ප්‍රතිසංස්කරණය වෙනුවෙන් ලද රු.100,000 ක ප්‍රතිපාදන උපයෝජනය කර උක්ත ව්‍යාපෘතිය ඉටුකර නොතිබුණි.

4.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ 2009 ට පෙර ගැටුම්කාරී වාතාවරණය හේතුවෙන් අවතැන් වූ, සාමාජිකයින් 03 දෙනෙකුට වැඩි පවුල් සඳහා නිවාස වැඩසටහන - 2023 යටතේ මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රු.මිලියන 7.8 ක ප්‍රතිපාදන ලබා දී තිබූ අතර එයින් රු.3,200,000 ක ප්‍රතිපාදන ලබා දී තිබූ ප්‍රතිලාභීන් 04 දෙනෙකුගේ නිවාස ඉදිකිරීම්වලට අදාළ කටයුතු නිමකර නොතිබුණි.

(ආ) විමධ්‍යගත අයවැය වැඩසටහන - 2024 යටතේ අඩඩාලවිවෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ජුම්මා පෙරිය පල්ලි වාස තාප්පය ඉදිකිරීම සඳහා රු.3,000,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. ව්‍යාපෘතියේ වැඩ 2024 ඔක්තෝබර් 31 දින වන විට අවසන් කළ යුතු වුවත් 2025 අප්‍රේල් 16 දින වන විටත් රු.154,000 ක් වටිනා එක් කාර්යයක් නිමකර නොතිබුණි.

4.2 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

කල්මුණ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ ඇති පෙරියනීලාවනි 01 ග්‍රාම නිලධාරී වසමට අයත් කාවේරි ක්‍රීඩා සාමජයට විමධ්‍යගත අයවැය වැඩසටහන - 2024 යටතේ ක්‍රීඩාව ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය උපකරණ ලබාගැනීම වෙනුවෙන් වෙන් කර ඇති රු.200,000 ක මුදලින් අවශ්‍ය ක්‍රීඩා උපකරණ ලබා දීමකින් තොරව රු.198,000 ක් වටිනා ප්‍රක්ෂේපක යන්ත්‍රයක් (Projector) ලබා දී තිබුණි. ඒ අනුව නිසි ශක්‍යතා අධ්‍යනයකින් තොරව මිලදීගැනීම් සිදුකර තිබූ අතර එම උපකරණ භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

4.3 ප්‍රසම්පාදනයන්

(අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4 අනුව සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී අවම ලංසුව ඉදිරිපත් කරන සැපයුම්කරු තෝරාගත යුතු වුවත් සාඉන්දමරුගු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විමධ්‍යගත අයවැය වැඩසටහන - 2024 සටහන යටතේ සමෘද්ධි ප්‍රතිලාභීන්ට ජීවනෝපාය ආධාර ලෙස ගෑස් ලිප් බෙදා දීමේදී ප්‍රසම්පාදන කමිටුව විසින් අවම මිල ඉදිරිපත් කරන ලද ලංසුකරු තෝරා නොගැනීම මත රු.496,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) කෘෂිකර්ම අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථිකය නසා සිටුවීමේ ව්‍යාපෘතිය යටතේ අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් එළවන් පිරිමි පැටවුන්ගේ බර කිලෝග්‍රෑමයක් සඳහා රු.1,600 ක් සහ ගැහැණු පැටවුන්ගේ බර කිලෝග්‍රෑමයක් සඳහා රු.1,200 ක් වැනි අඩු මිලකට ලබාගෙන තිබියදී එම කාල සීමාව තුළදී ම අඩිඩාලව්වෙන, නින්දවුර්, ආලයඩිවෙම්බු සහ සම්මන්තුර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිරිමි සහ ගැහැණු එළුවන් අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදීගත් වටිනාකමට සාපේක්ෂව ඉහළ මිලකට මිලදීගෙන ඇති බව නිරීක්ෂණය වූ අතර එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එළුවන් කිලෝග්‍රෑම 1286 ක් සඳහා රු.308,000 ක මුදලක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(ඇ) දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැරණිගම ග්‍රාම සේවා වසමේ දැහැන් පෙර පාසල ප්‍රතිසංස්කරණය කිරීම යටතේ රු.23,410 ක් වටිනා බජාජ් රීගල් සිවිලිම් විදුලි පංකා 03 ක් ස්ථාපනය කිරීමට ඇස්තමේන්තු කර තිබූ නමුත් ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කළ බජාජ් සන්නම නාමය වෙනුවට MEN සන්නම නාමයට අයත් විදුලි පංකා 03 ක් මිලදීගෙන තිබුණි. 2024 ජූනි 06 දින මිලදීගන්නා ලද විදුලි පංකාවලින් 02 ක් 2025 පෙබරවාරි 10 දින වන විටත් අක්‍රීයව තිබූ අතර වගකීම් කාලය ඉක්මවීමට පෙර එම උපකරණ නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

(අ) උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සංස්කෘතික මධ්‍යස්ථානයට භාණ්ඩ මිලදී ගැනීම සඳහා ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජන මාධ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ලබා දුන් රු.353,000 ක මුදලින් පරිගණකයක් මිලදීගෙන තිබුණු නමුත් එය භාවිතයට නොගෙන ගබඩාව තුළ නිෂ්කාර්යව පැවතුණි.

(ආ) දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් DCB ව්‍යාපෘතිය යටතේ දම්රෝ ආයතනය වෙතින් ප්ලාස්ටික් පුටු 145 ක් වට්ටමක් යටතේ 2024 නොවැම්බර් 18 දින මිලදී ගෙන තිබුණි. එම පුටු සමානුපාතික පදනම මත ප්‍රතිලාභීන්ට බෙදා දුන්නද සමහර ප්‍රතිලාභීන් එම පරිත්‍යාග කළ පුටුවලින් නැවත පුටු 131 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට භාර දී තිබූ අතර ඒවා ඉන්වෙන්ටරි ගත කර නොතිබුණි. ඉන් පුටු 104 ක් ගබඩාවේ තබා තිබූ අතර අනෙකුත් පුටු සම්බන්ධව කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) 2024 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අක්කරපත්තුව - 13 ග්‍රාම නිලධාරී වසමේ හල්ලාඒ මන්ද්‍රම් සමිතිය වෙත රු.295,000 ක් වටිනා අහල් 55 ක ස්මාර්ට් රූපවාහිනී යන්ත්‍රයක් ලබා දී තිබුණු නමුත් මාස 07 ක් ඉක්මවා ගොස් ඇතත් භාවිතයකින් තොරව සමිතියේ සභාපතිවරයාගේ නිවසේ නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) 2024 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ අක්කරපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අක්කරපත්තුව - 20 ග්‍රාම නිලධාරී වසමට අයත් බුලට් ප්‍රජා මධ්‍යස්ථානයට රු.346,500 ක් වටිනා ශබ්ද පද්ධති ආශ්‍රිත උපකරණ 12 ක් ලබා දී තිබූ නමුත් ඉන් උපකරණ 08 ක් පමණක් වෙනත් පෞද්ගලික ගොඩනැගිල්ලක ගබඩා කර තිබුණි. ඉතිරි උපකරණ 04 සම්බන්ධයෙන් විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවුණි.

4.5 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වන ගැබිණි සහ කිරිදෙන මව්වරුන් සඳහා පෝෂණ දීමනාව ලබාදීමේ වැඩසටහන යටතේ සම්මන්තුර සහ අඩඩාලව්වෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල 2022 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වවුචර් පත් බෙදා දීමේ ක්‍රියාවලිය තුළ මාණ්ඩලික නිලධාරීන්ගේ දුර්වල අධීක්ෂණය සහ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ක්‍රියාත්මක නොවීම මත විෂයභාර නිලධාරීන්ගේ දෙදෙනෙකු රු.5,356,000 ක මූල්‍ය වංචාවක් සිදුකර තිබුණි.

4.6 පාඩු හා හානි

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සද්ධාතිස්සපුර ගබඩාව 2015 සැප්තැම්බර් 21 දින සොරුන් විසින් විවෘත කර භාණ්ඩ රැගෙන යාම නිසා සිදු වූ පාඩුව රු.850,738ක් ලෙස තක්සේරු කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඒ පිළිබඳව ඉදිරි පියවර ගෙන නොතිබුණි.

4.7 අනාවර්තික ගනුදෙනු

පරිපාලන වියදම් ගෙවීම

(i) 2022/2023 මහ කන්නයේ වී මිලදී ගැනීමේ වැඩසටහන හා වී තොග බැහැර කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2023 පෙබරවාරි 09 දිනැති හා අංක DRD/2023-1 දරන චක්‍රලේඛයේ 4.2 වගන්තිය අනුව වී මිලදී ගැනීමේ දී වන මෙහෙයුම් වියදම් අදාළ මුදල් රෙගුලාසි, චක්‍රලේඛ සහ අනෙකුත් රජයේ අනුමැතීන්ට යටත්ව සිදු කිරීමට දිස්ත්‍රික් ලේකම් විසින් පියවර ගත යුතු වුවත් අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සාමාන්‍ය ව්‍යාපෘති සඳහා පරිපාලන වියදම් වෙන් කරන පරිදි සමස්ථ ප්‍රතිපාදන මුදල වන රු.3,089,000,000න් 1% ප්‍රතිශතයක් ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක් සඳහා රු.30,890,000ක් පරිපාලන වියදම් සඳහා ප්‍රතිපාදන වෙන් කරවා ගනිමින් චක්‍රලේඛයට පටහැනිව නිලධාරීන් විසින් සභ්‍ය වශයෙන් දරන ලද වියදම් නොසලකා හැර සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ වාචික උපදෙස් මත යැයි සඳහන් කරමින් අම්පාර දිස්ත්‍රික් ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් පත්කර ගනිමින් එම කමිටු තීරණය අනුව අදාල නිලධාරීන්ගේ මූලික වැටුපෙන් ¼ ක වටිනාකමකට සමාන මුදලක් ඔවුන් ව්‍යාපෘතියට සම්බන්ධව වූ මාස ගණන මත පදනම්ව එකතුව රු.15,580,562 ක් පරිපාලන වියදම් ලෙස 2023 ජූලි මස වන විට ගෙවා අවසන් කර නිබුණි.

(ii) ඉහත චක්‍රලේඛයේ 2.3.2 වගන්තිය අනුව මෙම වැඩසටහන 2023 මාර්තු හා අප්‍රේල් මාස තුල දී අවසන් විය යුතු වුවද 2024 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ ගබඩාවන් තුළ ඉතිරිව තිබූ සහල් කිලෝග්‍රෑම් 420,546 ක් හා වී කිලෝග්‍රෑම් 8,779,903 ක තොග සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය අවසන් වී නොතිබිය දී ඒ සම්බන්ධ පරිපාලන වියදම් ලෙස ඉහත සඳහන් මුදල නිලධාරීන් වෙත ගෙවා නිබූ බව නිරීක්ෂණය විය.

(iii) නියැදි විගණන පරීක්ෂණය අනුව උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පරිපාලන වියදම් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ ඉහත සඳහන් කමිටු තීරණය මත එක් එක් නිලධාරියාගේ මූලික වැටුපෙන් ¼ ක දීමනාවට අමතරව නිවාඩු දින වැටුප්, ගමන් වියදම් හා අතිකාල දීමනා වශයෙන් ද රු.367,181 ක් නිලධාරීන් 16 දෙනෙකු වෙත ගෙවීම් කර නිබුණි.

4.8 කළමනාකරණ දුර්වලතා

(අ) මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සමඟිපුර සමෘද්ධි බැංකුවේ 2025 පෙබරවාරි 24 දිනට කල් පසු වූ ණය රු.17,565,390 ක ශේෂයක් පවතින අතර එම ණය මුදල් අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) මහඔය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ස්වභාවික ආපදාවලින් සිදු වූ නිවාස හානි සඳහා වන්දි ගෙවීමට සමාලෝචිත වර්ෂයේ ලද ප්‍රතිපාදන වලින් රු.10,572 ක් වටිනා චෙක්පත් 02 ක් තවමත් වන්දි ගෙවීම සඳහා නිකුත් නොකර කාර්යාලය තුළ රඳවා තබා තිබුණි.

(ඇ) අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමෘද්ධි ප්‍රජා මූල බැංකු 45 ක් හරහා ප්‍රතිලාභීන් 443,771 දෙනෙකු සඳහා රු.15,515,924,709 ක ණය මුදල් ලබා දී තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රතිලාභීන් 33,976 දෙනෙකුගේ රු.2,685,152,942 ක් අය කරගෙන නොතිබූ අතර ඉන් ප්‍රතිලාභීන් 4630 දෙනෙකු රු.337,025,097 ක් බොල් ණය ලෙස හඳුනාගෙන තිබුණි.

(ඈ) ජනාධිපති ලේකම් කාර්යාලයේ විශේෂ අරමුදල් වැඩසටහන යටතේ සම්මන්තුර මුස්ලිම් මහා විද්‍යාලයේ මායිම් තාප්පය ඉදිකිරීම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුවේ සඳහන් ගිවිසුම් කාලය තුළ වැඩ නිම නොකළ හොත් කොන්ත්‍රාත්කරුගේ මුදලින් දිනකට 0.05% ක ප්‍රමාද ගාස්තුවක් අයකළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් දින 52 ක් සඳහා රු.116,073 ක ප්‍රමාද ගාස්තුවක් අයකර ගත යුතුව පැවතුණි.

(ඉ) ජනාධිපති ලේකම් කාර්යාලයේ විශේෂ අරමුදල් වැඩසටහන යටතේ 2024 දෙසැම්බර් මාසයේ දී සම්මන්තුර මුස්ලිම් මහා විද්‍යාලයේ ගේට්ටුව ඉදිකිරීම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුවේ සඳහන් ගිවිසුම් කාලය තුළ වැඩ නිම නොකළ හොත් කොන්ත්‍රාත්කරුගේ මුදලින් දිනකට 0.05% ක ප්‍රමාද ගාස්තුවක් අයකළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් දින 88 ක් සඳහා රු.209,746 ක ප්‍රමාද ගාස්තුවක් අයකර ගත යුතුව පැවතුණි.

(ඊ) 2022/ 2023 මහ කන්නයේ වී මිලදී ගැනීමේ හා වී තොග බැහැර කිරීමේ වැඩසටහන යටතේ රජය විසින් වී මිලදීගෙන අඩු ආදායම්ලාභීන් වෙත සහල් ලබා දීමෙන් අනතුරුව සහල් මෝල් හිමියන් භාරයේ පැවති රජයේ වී තොග සහල් කර අලෙවි කිරීම සම්බන්ධයෙන් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද 2023 ජූලි 17 දිනැති හා අංක DFD/MD/GPPP/PD/Maha/2022/23 දරන ලිපිය අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඉතිරි වී තොග සම්බන්ධයෙන්

2023 සැප්තැම්බර් මස සිදුකරන ලද පළමු ටෙන්ඩරය අනුව තෝරාගත් ගැනුම්කරු හට සහල් අලෙවිකිරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 09 ක් යටතේ තෝරාගෙන තිබූ වී මෝල් 22 ක් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදිය යුතුව තිබූ රු.154,064,224 ක් වටිනා සහල් කිලෝග්‍රෑම් 1,110,396 ක් 2025 මාර්තු 10 දින වන විටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත භාර දී නොතිබුණි.

(උ) දීර්ඝ කාලීන බදු අයකිරීම

දමන, අක්කරපත්තු හා කල්මුණ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ලබා දී තිබූ දිගු කාලීන බදු ඔප්පුවලට අදාළව රු.24,580,510 ක බදු මුදලක් 2024 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතුව පැවතුණි.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) 2024 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 2365 ක් ද, තථ්‍ය සේවක සංඛ්‍යාව 2808 ක් ද වූ අතර කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු 81 ක් පුරවා ගැනීමට හා 662 දෙනෙකුගෙන් යුතු අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත් පරිදි අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය මඟින් නිකුත් කරන ලද 2023 අප්‍රේල් 19 දිනැති පත්වීම් ලිපිය අනුව ඒ.එල්.ඒ. රෂිඩ් යන නිලධාරියා කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I ශ්‍රේණියේ සිට අධි ශ්‍රේණියට කුසලතා පදනම මත උසස් කර තිබුණි. ඒ අනුව එම නිලධාරියා 2023 මැයි 23 වන දින සම්මන්තුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත නිදහස් කර තිබූ නමුත් විගණන දිනය වන 2024 අප්‍රේල් 18 දින වන විටත් ඔහු එම තනතුරෙහි වැඩ භාරගෙන නොතිබුණි. තවද ඔහුගේ ඉල්ලීම පරිදි සුදුසු සේවා ස්ථානයක් නොලැබීම මත පෙර සේවා ස්ථානය වන සම්මන්තුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම කාර්යාලයෙන් ඔහුව නිදහස් කළ පසුත් පෙර තනතුර සඳහා 2023 ජූනි සිට 2023 දෙසැම්බර් දක්වා මාස 07ක වැටුප වන රු.434,840ක් ගෙවීම් කර තිබුණි. කෙසේ නමුත් ඔහුගේ පත්වීම් ලිපිය පරිදි එම ලිපියේ දින සිට සති 03ක් ඇතුළත පත්වීම් භාර ගත්තේ ද නැද්ද යන්න පිළිබඳව දැනුම්දිය යුතු වුවද මාස 11 ක් ගත වී ඇතත් මේ වන තෙක් එවැනි ලිඛිත දැනුම්දීමක් ද සිදුකර නොතිබුණි.

එම්.එච්.එම්. අරෂාත්
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04. පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

නිශ්චිත දර්ශකය	සත්‍ය නිමැවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස			
	100%-90%	75%-89%	50%-74%	0%-49%
යටිතල පහසුකම් ව්‍යාපෘති නිම කිරීම	100	-	-	-
සමාජ සුබසාධන සංවර්ධන ව්‍යාපෘති නිම කිරීම	100	-	-	-
ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති නිම කිරීම	100	-	-	-
පරිසර අංශයේ සංවර්ධන ව්‍යාපෘති නිම කිරීම	100	-	-	-

05. පරිච්ඡේදය - තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසර සංවර්ධන අරමුණු දක්වන්න

	ඉලක්ක / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
				0%-49%	50%-74%	75%-100%
1	සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම	1.1 2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන සියලුම පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාව තුරන් කිරීම. වර්තමාන තක්සේරු අනුව දිනකට ඩොලර් 1.25 ට වඩා අඩුවෙන් ආදායම් ලබන අය අන්ත දිළිඳු කාණ්ඩයට අයත් වේ 1.2 වසර 2030 වන විට ජාතික මට්ටමේ අර්ථ නිරූපණවලට අනුකූල වන පරිදි සියලුම ආකාරයේ දරිද්‍රතාවන්ගෙන් පෙළෙන සියලු වයස් කාණ්ඩවලට අයත් පිරිමින්, කාන්තාවන් හා ළමුන්ගේ අනුපාතය අවම වශයෙන් අඩකින් අඩුකිරීම. 1.3 පහළ මට්ටමේ අයත් ඇතුළත්ව සියළුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම සහ 2030 වන විට දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානම් කණ්ඩායම් ප්‍රමාණවත් ලෙස එමගින් ආවරණය වී තිබීම. 1.4 විශේෂයෙන්ම දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලක්විය හැකි අය ඇතුළුව සියලුම පිරිමින්ට සහ කාන්තාවන්ට 2030 වසර වන විට ආර්ථික සම්පත්, මූලික සේවාවන්, ඉඩම් හිමිකාරිත්වය හා පාලනය කිරීම සහ වෙනත් ආකාරයේ දේපළ උරුමයන්, ස්වාභාවික	i. දිස්ත්‍රික්කයේ පවුල් 56ක් සඳහා එළුවන් 168ක් බෙදා දීම. ii. ආර්ථික අපහසුතාවයෙන් පෙළුන පවුල් 811ක් නිරසර ආර්ථික ක්‍රමවේද මගින් නඟා සිටුවීම iii. ප්‍රතිලාභීන් 80,327 සඳහා අස්වැසුම ප්‍රතිලාභ ලබාදීම iv. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 177ක් බිහිකිරීම v. කාර්මික හා කෘෂි කාර්මික අපනයන නිෂ්පාදන ව්‍යාපෘති 36ක් බිහිකිරීම vi. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය කාලගුණය හා සම්බන්ධ ආන්තික සිදුවීම් අවම කිරීම සඳහා කටයුතු කරනු ලබයි.			100%

		සම්පත්, සුදුසු නව තාක්ෂණය සහ ක්ෂුද්‍ර මූල්‍ය ඇතුළුව මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශවීමට සමාන අයිතිවාසිකම් තහවුරු කිරීම. 1.5 2030 වන විට දරිද්‍රතාවෙන් පෙළෙන්නන්ගේ සහ අවදානමට ලක් විය හැකි තත්වයේ සිටින්නන්ගේ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සහ ඔවුන් කාලගුණික තත්වයන්ගෙන් ඇති වන්නාවූ හානිකර බලපෑම් ද ආර්ථික සමාජ සහ පරිසරමය වශයෙන් ඇතිවන්නාවූ හානි සහ ආපදාවලට නිරාවරණයවීම ද අඩු කිරීම.				
2	සාගිනි නැතිකර, ආහාර සුරක්ෂිතතාව හා ඉහළ පෝෂණ තත්ත්වයක් සාක්ෂාත් කර ගැනීම සහ තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.	2.1 2030 වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන්ම ළදරුවන් ද ඇතුළත්ව දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානමට ලක්වී තිබෙන ජනතාවට ආරක්ෂාකාරී, පෝෂණයෙන් යුත්, ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබාගැනීමට හැකි බව තහවුරු කිරීම. 2.2 අවුරුදු පහට අඩු ළමුන් සම්බන්ධයෙන් මිටිවීම සහ ක්ෂය වීම පිළිබඳ අන්තර්ජාතික වශයෙන් එකඟතාවට පත්වූ ඉලක්ක 2025 වන විට ලඟාකරගැනීම ද ඇතුළත්ව 2030 වන විට සියලුම ආකාරයේ පවත්නා මන්දපෝෂණ තත්වයන් තුරන් කිරීම සහ නවයොවුන් ගැහැණු ළමුන්ගේ, ගැබිණි මාතාවන්ගේ, කිරිදෙන මවුවරුන්ගේ සහ වයස්ගත පුද්ගලයින්ගේ පෝෂණ අවශ්‍යතාවන්ට විසඳුම් ලබා දීම. 2.3 2030 වන විට කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයන්ගේ, විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ස්වදේශික ජනයාගේ, ගොවි පවුල් සහ ධීවරයින්ගේ කෘෂිකාර්මික	i. සහල් කි.ග්‍රෑ. 2,798,730 ක් ප්‍රතිලාභීන් 279,635ක් වෙත බෙදා දීම. ii. ලෝක ආහාර වැඩසටහන යටතේ ආහාර සහය වැඩසටහන මගින් ලද සහල් මළු 5,491ක් (එකක් කි.ග්‍රෑ. 24 බැගින් යුතු) හා පරිප්පු මළු 2,478 (එකක් කි.ග්‍රෑ 20 බැගින් යුත්),එළවළු තෙල් කෑන් 10,981 (එකක් ලීටරය බැගින් යුත්)ප්‍රතිලාභීන් 10,981 අතර බෙදා දෙන ලදි. iii. අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 18ක අක්කර 401.01ක් ආවරණය වන පරිදි මුං වගා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. iv. අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 2ක අක්කර 1ක්			100%

		ඵලදායීතාව සහ ආදායම, ඉඩම්වලට ආරක්ෂාකාරීව සහ සමාන ලෙස ප්‍රවේශ වීමේ අවස්ථාවන්, අනෙකුත් නිෂ්පාදන සම්පත් හා ප්‍රදානයන්, දැනුම, මූල්‍ය සේවා, වෙළඳපොළ සහ වටිනාකම් එකතු කිරීම් හා ගොවිපළ නොවන රැකියා සඳහා අවස්ථාවන් ලබා දීම මගින් දෙගුණ කිරීම.	ආවරණය වන පරිදි උඳු වගා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම. v. තිරසර ගෙවතු වගා 2,294 ක් ආරම්භ කිරීම. vi. රුපියල් මිලියන 1.75ක ප්‍රතිපාදන මඟින් කෘෂිකාර්මික ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කිරීම. vii. තරුණ කෘෂි නවීකරණ ගම්මාන වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4ක ප්‍රතිලාභීන් 157ක් ආවරණය වන පරිදී රුපියල් මිලියන7.966ක් විටනා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. viii. කෘෂි අංශ නවීකරණ ව්‍යාපෘතිය(ASMP) යටතේ නවීන තිරසර කෘෂි තාක්ෂණය කටු අනෝදා හා බඩඉරිඟු වගාවට හඳුන්වාදීම			
3	නිරෝගීමත් ජීවිතයක් සහතික කර සෑම වයසකම සිටින සෑම අයෙකුගේම යහජීවනය ප්‍රවර්ධනය කිරීම	3.1 2030 වන විට ලෝකයේ මාතෘ මරණ ආනුපාතිකය සජීවී උපත් 100,000 ට 70 දක්වා අඩු කිරීම. 3.2 සියලුම රටවල් වල නවජාත මරණ අනුපාතිකය සජීවී උපත් 1000 ට 12 දක්වා සහ අවුරුදු පහට අඩු ළමා මරණ සජීවී උපත් 1000 ට අවම වශයෙන් 25 දක්වා අඩු කිරීමේ ඉලක්කය ඇතිව 2030 වන විට අලුත උපන් සහ වයස අවුරුදු පහට අඩු ළමුන්ගේ වළක්වාගත හැකි මරණ තුරන් කිරීම 3.5 හානිකර ආකාරයට මද්‍යසාර භාවිතය සහ අන්තරායකාරී ඖෂධ භාවිතය වැළක්වීමේ ක්‍රියාමාර්ග සහ ප්‍රතිකාර ශක්තිමත් කිරීම.	i. පෝෂණ අවශ්‍යතා ඇති අඩු ආදායම්ලාභී ගර්භණී කාන්තාවන්ගේ පෝෂණ මට්ටම දරු ප්‍රසූතිය දක්වා හොඳින් පවත්වාගෙන යාම තහවුරු කිරීම සඳහා අයත්වන වැඩසටහන් 1647 ක් ක්‍රියාත්මක කර ඇත. ii. අඩු අදායම්ලාභී පවුල්වල දරුවන් 1122 ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා කැපකරු වැඩසටහන් ආරම්භ කර එහි ප්‍රතිලාභ දරුවන් වෙත ලබා දීම. iii. අධ්‍යාපන හා සෞඛ්‍ය අංශයේ සංවර්ධනය සඳහා රුපියල් මිලියන			100%

			343.805ක් වටිනා ව්‍යාපෘති 520ක් ක්‍රියාත්මක කර ඇත iv. ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි,ජාතික ළමාරක්ෂක අධිකාරියේ නිලධාරීන්, මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ හා රාජ්‍ය නොවන සංවිධානවල සහභෝගය ඇතිව මෙම ඉලක්ක ළඟා කර ගැනීමට කටයුතු කර ඇත. උදා :- සේරි ශ්‍රී ලංකා වැඩසටහන			
4	සමානාත්මතාවයෙන් හා ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කරමින් සැමට ජීවිත කාලය පුරා ඉගෙනුම් අවස්ථා උදා කර දීම	4.1 2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබාගැනීමට හැකි වන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ, ප්‍රාථමික, සහ ද්විතීයික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම. 4.2 2030 වන විට සියලුම ගැහැණු ළමුන්ට සහ පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට, සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම හා එමගින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටින බව තහවුරු කිරීම. 4.3 2030 වන විට සියලුම කාන්තාවන්ට සහ පිරිමින්ට ගුණාත්මක වශයෙන් ඉහළ සහ අඩු මුදලකට ලබා ගත හැකි විශ්වවිද්‍යාල අධ්‍යාපනය ද ඇතුළත්ව තාක්ෂණික, වෘත්තීය සහ තෘතීයික අධ්‍යාපනය ලබා ගැනීමට හැකිවීම.	i. 2024 වර්ෂයේදී පාසැල් යාමෙන් ඉවත් වූ දරුවන් 426ක් නැවත පාසල් යාම සඳහා යොමු කර ඇත. i. අධ්‍යාපන හා සෞඛ්‍ය අංශයේ සංවර්ධනය සඳහා රුපියල් මිලියන 343.805ක් වටිනා ව්‍යාපෘති 520ක් ක්‍රියාත්මක කර ඇත. ii. දිස්ත්‍රික්කයේ පවත්වනු ලබන සෑම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමකදීම දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්, පළාත් මට්ටමේ නිලධාරීන් හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සාමාජිකයින් සමඟ පාසල් සම්බන්ධයෙන් ඇති වී ඇති ගැටළු පිළිබඳව හා ගුරුවරුන්, දරුවන් සම්බන්ධව ඇති වන ගැටළු පිළිබඳව සාකච්ඡා කර සුදුසු විසඳුම් ලබා දී අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා පාසල්වල ගුණාත්මකභාවය තහවුරු කිරීම.			100%

			iii. තරුණ තරුණියන් 89ක් සඳහා වෘත්තිය ප්‍රහුණුව ලබා දී ඇත.			
5	ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව සාක්ෂාත් කරමින් සියලු කාන්තාවන් සහ ගැහැණු දැරියන් සවිබල ගැන්වීම	5.1 කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම. 5.2 මානව කුට්ටනය ලිංගික සහ වෙනත් ආකාරයේ දූෂණයන්ද ඇතුළත්ව කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහිව පොදු සහ පෞද්ගලික ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීම. 5.5 දේශපාලන, ආර්ථික, සහ සාමාන්‍ය ජීවිතයේ සියලුම අවස්ථාවන්හි තීරණ ගැනීමේදී කාන්තාවන්ට නායකත්වය සහ සමාන අවස්ථාවන් සැලසීම හා ඵලදායී අන්දමින් සහභාගී වීම තහවුරු කිරීම.	i. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වනිතා සංවර්ධන නිලධාරිණිය හරහා සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවයේ නියුතු වෙනත් අදාළ නිලධාරීන් මඟින් (උදා:- සමාජ සේවා නිලධාරීන් හරහා) කාන්තාවන් හා ගැහැණු දරුවන් සවිබල ගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ කාන්තාවන් හා ගැහැණු දරුවන් සම්බන්ධ ගැටළු විසඳීම. 1. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීමේදී කාන්තා මූලික ව්‍යවසායන් කෙරෙහි අදාළ නිලධාරීන්ගේ අවධානය යොමු කිරීම.			100%
6	සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබා ගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම	6.1 2030 වන විට සියලු දෙනාට සමානාත්මතාවයෙන් යුතුව ආරක්ෂාකාරී සහ අඩු මිලකට පානීය ජලය ලබා ගැනීමට හැකි වීම. 6.2 2030 වන විට සියලුම දෙනාට ප්‍රමාණවත් ලෙස සහ සමානත්වයෙන් යුක්තව සනීපාරක්ෂාව සහ ස්වස්ථතාව ලබා ගැනීමට හැකි වීම සහ එළිමහනේ මළපහ කිරීම තුරන් කිරීම සහ විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ගැහැණු ළමුන්ගේ, සහ අවදානමට ලක්විය හැකි තත්වයේ සිටින පුද්ගලයින්ගේ විශේෂ අවශ්‍යතාවන් කෙරෙහි අවධානය යොමුකිරීම.	i. නාගරික සංවර්ධන,ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වූ නැවත පදිංචි කිරීමේ වැඩසටහන් යටතේ ජල සැපයුම් ව්‍යාපෘති 231ක් ක්‍රියාත්මක විය. ii. විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ රුපියල් මිලියන 7.95ක් වටිනා පානීය ජල ව්‍යාපෘති 10ක් ක්‍රියාත්මක විය. iii. දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ රුපියල් මිලියන 4.5ක් වටිනා සනීපාරක්ෂක ව්‍යාපෘති 11ක් (පාසල් ව්‍යාපෘති 8ක් හා පෙර පාසල් ව්‍යාපෘති 3ක්) ක්‍රියාත්මක විය. iv. නිදන්ගත වකුගඩු රෝගී තත්ත්වයෙන් ආරක්ෂාවීම සඳහා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස 6ක ප්‍රතිඅාස්‍රැනි ජල පිරිපහදු			100%

			25ක් ස්ථාපිත කර ඇති අතර 2024 වර්ෂය සඳහා එම ජල පිරිපහදු විදුලිබිල්පත් පියවීම සඳහා රු.2,722,163.75 වැය කර ඇත.			
7	සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වාසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම	7.1 2030 වන විට සියලු දෙනාටම අඩු මිලකට ලබා ගත හැකි විශ්වාසදායී නවීන බලශක්ති මූලාශ්‍රවලට ප්‍රවේශ විය හැකිබව තහවුරු කිරීම	i. ආගමික ස්ථාන ඇතුළුව පොදු ස්ථානවල රුපියල් මිලියන 13.2ක් වටිනා සූර්ය බල විදුලි උත්පාදන ව්‍යාපෘති 16ක් ක්‍රියාත්මක විය. ii. නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වූ නැවත පදිංචි කිරීමේ වැඩසටහන් යටතේ නව විදුලි සැපයුම් ව්‍යාපෘති 463ක් ක්‍රියාත්මක විය.			100%
8	සියල්ලන් සඳහාම පෝෂිත සහ පරිපූර්ණ, තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම	8.3 ඵලදායී ක්‍රියාකාරකම් වලට, සුනිසි රැකියා අවස්ථාවන්ට, ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලීභාවයට සහාය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්තීන් ප්‍රවර්ධනය කිරීම. මූල්‍ය සේවාවන්ට ප්‍රවේශ වීමට අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර, කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම දිරිගැන්වීම. 8.5 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී සහ නිසි රැකියා අවස්ථාවන් ලබාදීම 8.9 2030 වන විට දේශීය සංස්කෘතිය, නිෂ්පාදනය සහ රැකියා අවස්ථාවන් ප්‍රවර්ධනය කරන්නා වූ තිරසර සංචාරක කර්මාන්ත පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.	1. වනිතා සංවර්ධන නිලධාරිනිය, විදානා නිලධාරීන්, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය, සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන් සමඟ එක්ව තමන්ගේම ව්‍යාපාර අදහස් ක්‍රියාත්මක කිරීම සඳහා මුලපිරීමට අවස්ථාව සැලසීම අරමුණු කොට විවිධ පුහුණු හා තොරතුරු වැඩසටහන් රැසක් පවත්වන ලදී. 2. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 177ක් බිහිකරන ලදි. 3. කාර්මික හා කෘෂි අපනයන ව්‍යාපෘති 36ක් බිහි කරන ලදි. 4. තරුණ තරුණියන් 89ක් සඳහා වෘත්තිය පුහුණු අවස්ථා ලබා දෙන ලදි. 5. තිරසර සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධනයට සමගාමීව රැකියා			100%

			අවස්ථා බිහිකිරීම සඳහා පොතුවිල් ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශය තුළ රුපියල් මිලියන 9.43ක ප්‍රතිපාදන මගින් Blue Flag Beach ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු යොදා ඇත. 6. රුපියල් මිලියන 35.75ක වියදමින් සංචාරක ව්‍යාපාර සංවර්ධනයට අදාල ව්‍යාපෘති 10ක් ක්‍රියාත්මක විය.			
9	සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරිගැන්වීම.	9.1 ආර්ථික සංවර්ධනය සහ මානව යහපැවැත්ම වෙනුවෙන් සියලු දෙනාටම ලබාගත හැකි සහ ප්‍රවේශ විය හැකි වීම අවධානයට ගෙන කලාපීය සහ ජාතික දේශසීමාවන් අතර සිදුකරන යටිතල පහසුකම් ද ඇතුළත්ව ගුණාත්මක වශයෙන් ඉහළ විශ්වාසදායී තිරසර සහ ආපදාවන්ට ඔරුන්තු දෙන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. 9.2 සියලුදෙනාම අන්තර්ගත වන්නා වූ සහ තිරසර වූ කර්මාන්තකරණය ප්‍රවර්ධනය කිරීම, 2030 වන විට ජාතික තත්වයන්ට අනුකූල රැකියාවන් සැපයීමේදී කර්මාන්ත අංශයේ දායකත්වය කැපී පෙනෙන ලෙස ඉහළ නැංවීම සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල මෙම දායකත්වය දෙගුණයක් බවට පත් කිරීම.	i. රුපියල් මිලියන 57.97ක වියදමින් මාර්ග සංවර්ධන ව්‍යාපෘති 65ක් ක්‍රියාත්මක විය. ii. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 177ක් බිහිකරන ලදි. iii. කාර්මික හා කෘෂි අපනයන ව්‍යාපෘති 36ක් බිහි කරන ලදි.			100%
10	රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩු කිරීම.	10.1 2030 වන විට ජනගහනයේ පහළ මට්ටමේ සිටින 40% ගේ ආදායම් වර්ධනය ජාතික මට්ටමේ සාමාන්‍ය අගයට වඩා වැඩියෙන් ප්‍රගතිශීලී ලෙස වර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.	i) මේ යටතේ රජයේ විශේෂ සහන වැඩසටහන් ලෙස ක්‍රියාත්මක වන “අස්වැසුම” වැඩසටහන යටතේ විශේෂයෙන් හඳුනාගත් දරිද්‍රතා මට්ටම පහළ මට්ටමේ සිටින පුද්ගලයින් සඳහා ආර්ථික සහන			100%

		10.2 2030 වන විට වයස, ලිංගිකත්වය, ආබාධිතබව, ජන වර්ගය, ජාතිය, ආගම හෝ ආර්ථික හෝ වෙනත් තත්වයන් පිළිබඳව තැකීමකින් තොරව සියලු දෙනාගේ සමාජ ආර්ථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම. 10.7 හොඳින් කළමනාකරණය කරන ලද සහ සැලසුම් කරන ලද ආකාරයට සංක්‍රමණ කටයුතු ක්‍රියාවට නැංවීම ද ඇතුළත්ව වගවීමෙන් යුක්තව, මානව සංවිධානගතව, ආරක්ෂාකාරීව ජනතාවට ඔබ මොබ යාමේ සහ සංක්‍රමණය වීමේ පහසුකම් සැලසීම.	සපයා ඇත.මේ යටතේ ප්‍රතිලාභීන් 80327ක් ප්‍රතිලාභ ලබා ඇත. ii) අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ජාතික ඒකාබද්ධ ක්‍රමය ප්‍රවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘති (ආන්තීකරණයට ලක්වූ කාන්තා මූලික පවුල් ආර්ථිකව සවිබල ගැන්වීම, ආන්තීකරණයට ලක් වූ පාසල් දරුවන් සවිබල ගැන්වීම හා පුනරුත්ථාපනය වූ පුද්ගලයින් සහ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිව සිට පුනරුත්ථාපනය වූ තරුණ තරුණියන් සහ ජීවනෝපාය සංවර්ධනය) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා සෑම වර්ෂයකදීම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සිදුකරනු ලබයි. i. මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වූ පුද්ගලයින් 339 ක් මත්ද්‍රව්‍ය භාවිතයෙන් මුදාගෙන පුනරුත්ථාපනය කර සමාජගත කරන ලදී. ii. මත්ද්‍රව්‍ය විකිණීමේ කටයුතුවල නිරත වූ පවුල් 92ක් එයින් මුදාගෙන පුනරුත්ථාපනය කර සමාජගත කරන ලදි.			
11	නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම.	11.1 2030 වන විට සියලුම දෙනාට ආරක්ෂාකාරී සහ අඩු මිලට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩිදියුණු කිරීම.	i. නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස ව්‍යාපෘති 96ක් නිම කරන ලදි.(රුමිලියන 1 නිවාස)			100%

		11.2 විශේෂයෙන්ම අවදානමට ලක් විය හැකි තත්වයේ සිටින කාන්තාවන්, ළමුන්, ආබාධ සහිත පුද්ගලයින්, සහ වයස්ගත පුද්ගලයින්ට විශේෂ අවධානය යොමු කරමින් මහාමාර්ගවල ආරක්ෂාව ඉහළ නැංවීම, පොදු ප්‍රවාහන පද්ධති සැලකිය යුතු මට්ටමින් ව්‍යාප්ත කිරීම මගින් 2030 වන විට සියලුම දෙනාට ආරක්ෂාකාරී අඩු මිලට ලබා ගත හැකි ප්‍රවේශවිය හැකි සහ තිරසර ප්‍රවාහන පද්ධති ලබා දීම. 11.4 ලෝකයේ ස්වාභාවික සහ සංස්කෘතික උරුමයන් රැකගැනීම හා ආරක්ෂා කරගැනීම සඳහා වූ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීම. 11.5 2030 වන විට දරිද්‍රතාවෙහි සහ අවදානමට පත්විය හැකි තත්වයන්හි සිටින පුද්ගලයින් සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් ජලය මගින් සිදුවන්නා වූ විනාශයන් ද ඇතුළු ආපදාවලින් ලෝකයේ දළ දේශීය නිෂ්පාදිතයට සිදුවන සෘජු ආර්ථික හානිය සලකිය යුතු ලෙස අඩු කිරීම සහ මෙමගින් බලපෑමට හා මරණයට පත් වන පුද්ගලයින්ගේ සංඛ්‍යාව කැපී පෙනෙන ලෙස අඩු කිරීම. 11.7 2030 වන විට විශේෂයෙන්ම කාන්තාවන්ට සහ ළමුන්ට, වයස්ගත පුද්ගලයින්ට සහ ආබාධ සහිත පුද්ගලයින්ට ආරක්ෂාකාරී වන, සියලු දෙනා අන්තර්ගත වූ, සහ පහසුවෙන් පිවිසිය හැකි පොදු හරිත අවකාශයන් ලබා දීම.	ii. නැවත පදිංචි කිරීමේ නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස ව්‍යාපෘති 47ක් නිම කරන ලදි.(රුමිලියන 0.6 නිවාස) iii. රුපියල් මිලියන 57.97ක වියදමින් මාර්ග සංවර්ධන ව්‍යාපෘති 65ක් ක්‍රියාත්මක විය. iv. ආගමික හා සංස්කෘතික අංශයේ සංවර්ධනය සඳහා රුපියල් මිලියන 235.965ක වියදමින් ව්‍යාපෘති 435ක් ක්‍රියාත්මක කරන ලදි. v. අම්පාර ප්‍රාදේශීය ලේකම් ලේකම් කොට්ඨාසයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 11ක් වෙන් කරන ලදි. vi. ළමා උද්‍යාන සහ වෙරළ උද්‍යාන ඇතුළුව රුපියල් මිලියන 23.58 වටිනා විනෝද උද්‍යාන ව්‍යාපෘති 93ක් ක්‍රියාත්මක කරන ලදි.			
12	පරිභෝජන හා නිෂ්පාදන රටාවන්හි තිරසාරත්වය සහතික කිරීම.	12.2 030 වන විට ස්වභාවික සම්පත් තිරසර අන්දමින් කළමනාකරණය කිරීම සහ කාර්යක්ෂමව භාවිතා කිරීම වෙත ළඟා වීම. 12.3 2030 වන විට සිල්ලර සහ පරිභෝජන මට්ටම්වල ඒක පුද්ගල ආහාර අපතේ යාම	i. දිස්ත්‍රික් කෘෂිකර්ම අංශය, අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ අනෙකුත් ආශ්‍රිත ආයතන හරහා තිරසර ගොවිතැන් හා නිෂ්පාදන ක්‍රම සහ පසු අස්වනු හානි අවම කිරීමේ			100%

		අවම කිරීම සහ පශ්චාත් අස්වනු හානි ඇතුළුව නිෂ්පාදන හා සැපයුම් දාමයන්හි සිදුවන්නා වූ අපතේ යාම අවම කිරීම.	ක්‍රම අනුගමනය කිරීමට ගොවීන් දැනුවත් කරන ලදි.			
13	දේශගුණික විපර්යාස හා ඒවායේ බලපෑම්වලට එරෙහිව හදිසි ක්‍රියාමාර්ග ගැනීම.	13.1 සියලුම රටවල කාලගුණය සම්බන්ධ විපත් සහ ස්වභාවික ආපදාවලට ඔරොත්තු දීමේ සහ එවැනි තත්වයන්ට මුහුණ දීමේ හැකියාව ශක්තිමත් කිරීම. 13.3 කාලගුණ වෙනස්වීම අවම කිරීම, ඒ අනුව හැඩගැසීම, බලපෑම අවම කිරීම සහ පූර්ව අනතුරු සම්බන්ධයෙන් අධ්‍යාපනය, දැනුවත්භාවය ඉහළ නැංවීම සහ මානව සහ ආයතනික ධාරිතාවන් ඉහළ නැංවීම.	i. 2024 නොවැම්බර් මස ඇතිවූ ගංවතුර තත්ත්වය තුළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය, ආපදා කළමනාකරණ ඒකකයේ කාර්ය මණ්ඩලය ශ්‍රී ලංකා පොලීසිය, යුධ හමුදාව සහ අනෙකුත් වගකිවයුතු නිලධාරීන් ගංවතුරින් විපතට පත් ජනතාව සඳහා සහන සැළසීමට විශාල කාර්යභාරයක් ඉටු කරන ලදි. ii. දිස්ත්‍රික්කයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 11ක ප්‍රතිපාදන වෙන් කරන ලදි. iii. ii) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ජල පෝෂක හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) හා CResMPA ව්‍යාපෘතිය යටතේ වැව් අලුත්වැඩියා හා ඉදිකිරීම් කටයුතු සිදුකරන ලදී. iv. සුළු වාරිමාර්ග අංශය සඳහා රුපියල් මිලියන 11.775ක් වටිනා ව්‍යාපෘති 9ක් ක්‍රියාත්මක කරන ලදි.			100%
14	තිරසාර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායී භාවිතය	14.1 2025 වන විට සමුද්‍රීය අපද්‍රව්‍ය සහ පෝෂක දූෂණය වීම ද ඇතුළුව විශේෂයෙන්ම ගොඩබිම් පදනම් කරගත් ක්‍රියාකාරකම් මගින් සිදුවන සියලුම ආකාරයේ සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ සැලකිය යුතු මට්ටමින් අවම කිරීම.	i. මේ යටතේ වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය හා ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ එක්ව සමුද්‍රීය පරිසරය හා වෙරළසන්න			100%

		14.2 2020 වන විට ආපදාවන්ට ඔරොත්තු දීමට සවිබල ගන්වමින් සහ සෞඛ්‍ය වත් සහ ඵලදායීතාවෙන් යුක්ත වන ආකාරයට සාගර යථා තත්වයට පත් කරමින් සමුද්‍රීය සහ වෙරළබඩ පරිසර පද්ධති තිරසර අන්දමින් කළමනාකරණය කිරීම සහ ආරක්ෂා කිරීම. 14.4 2020 වන විට මසුන්ගේ ජීව විද්‍යාත්මක ගති ලක්ෂණ අනුව තීරණය වී ඇති ආකාරයට තිරසර වශයෙන් උපරිම අස්වැන්නක් ලබා දිය හැකි ආකාරයට මත්ස්‍ය සම්පත් හැකි කෙටිම කාලයකදී නැවත යථා තත්වයට පත් කිරීම සඳහා කාර්යක්ෂම ලෙස මසුන් ඇල්ලීම පාලනය කිරීම සහ අසීමිතව, නීතිවිරෝධී, වාර්තානොකළ සහ පාලනය නොකළ හා හානිකර මසුන් මැරීමේ ක්‍රම භාවිතය අවසන් කිරීම සහ විද්‍යාත්මක පදනමකින් යුක්ත කළමනාකරණ සැලසුම් ක්‍රියාත්මක කිරීම. 14.5 2020 වන විට හොඳම විද්‍යාත්මක තොරතුරු සහ ජාතික සහ අන්තර්ජාතික නීතිවලට අනුකූලව වෙරළබඩ සහ සමුද්‍රීය ප්‍රදේශවලින් 10% ක් සංරක්ෂණය කිරීම. 14.7 2030 වන විට තිරසර ලෙස ධීවර සම්පත්, ජලය ආශ්‍රිත සංස්කෘතිය සහ සංචාරක කර්මාන්තය කළමනාකරණය හා තිරසර අන්දමින් සමුද්‍රීය සම්පත් භාවිතා කරමින් සංවර්ධනය වෙමින් පවත්නා කුඩා දිවයින් රාජ්‍යවලට සහ අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවලට ලැබෙන ආර්ථික ප්‍රතිලාභ වර්ධනය කිරීම.	පරිසර පද්ධතිය සුරක්ෂිත කිරීමටත්, ධීවර සම්පත් හරහා රටට හිමිවන ආර්ථික ප්‍රතිලාභ සංවර්ධනය කිරීමටත් විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති සිදුකරනු ලබයි. ii. තිරසර සංවර්ධනය තුළින් සංචාරක ආකර්ෂණය ඉහල නැංවීම සඳහා රාජ්‍ය ආයතන,රාජ්‍ය නොවන සංවිධාන සහ විවිධ පෞද්ගලික ආයතන මඟින් පානම වෙරළ තීරය ආශ්‍රිතව විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි.			
15	භූගෝලීය පරිසර පද්ධතීන්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර	15.1 2020 වන විට භූමියේ සහ ගොඩබිම අභ්‍යන්තරයේ පවත්නා මිරිදිය පරිසර පද්ධති සහ ඒවායින් ලැබෙන්නා වූ සේවාවන්, විශේෂ වනාන්තර, කඳු සහ වියළි බිම් අන්තර්ජාතික	i. පාරිසරික සංරක්ෂණය අරමුණු කරගෙන වන වගා ව්‍යාපෘති 60 ක් ක්‍රියාත්මක කරන ලදී..			100%

	කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියා කිරීම, ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය කර ආරක්ෂා කළු ප්‍රවර්ධනය කිරීම, ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම.	ගිවිසුම්වලට අනුකූල වන පරිදි සංරක්ෂණය, නැවත නගාසිටුවීම සහ තිරසර අන්දමින් භාවිතා කිරීම තහවුරු කිරීම. 15.2 2020 වන විට සියලුම වර්ගවල වනාන්තර තිරසර අන්දමින් කළමනාකරණය කිරීම ප්‍රවර්ධනය, වන විනාශය නැවත්වීම, විනාශ වූ වනාන්තර යථා තත්වයට පත්කිරීම සහ ජගත් මට්ටමින් වන රෝපණය සහ නැවත වන වගාව වර්ධනය කිරීම.				
16	තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සෑමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම.	16.1 සියලුම ස්ථානයන්හි සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් සහ ඒ ආශ්‍රිත මරණ කැපී පෙනෙන ලෙස අඩු කිරීම. 16.2 ළමුන් කෲර වධහිංසා කිරීම්වලට සහ අපයෝජනයට, සූරාකෑමට, කුට්ටනයට සහ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන්ට ලක් වීම අවසන් කිරීම. 16.3 සියලුම දෙනාට නීතියේ සාධාරණත්වය ලබා ගැනීමට හැකි වීම සහ ජාතික සහ අන්තර්ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම. 16.5 සියලුම ආකාරයේ අල්ලස සහ දූෂණ කැපී පෙනෙන ලෙස අඩු කිරීම. 16.6 සියලුම මට්ටම්වලදී ඵලදායී වගවීමෙන් යුක්ත සහ විනිවිදභාවයෙන් යුත් ආයතන පිහිටුවීම.	i) මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයින් 339 ක් ඉන් මුදවාගෙන පුනරුත්ථාපනය කර නැවත සමාජගත කිරීම. ii) නීතී විරෝධී මත්ද්‍රව්‍ය වෙළඳාමේ නිරතවූ පුද්ගලයින් 92 ක් ඉන් මුදවා ගෙන පුනරුත්ථාපනය කිරීම. iii) අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් 1122 සඳහා කැපකරු ක්‍රමයක් ක්‍රියාත්මක කර ඔවුන්ගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම. iv) සෑම තරාතිරකම ඵලදායී, වගකියන සහ විනිවිද පෙනෙන පරිදි ආයතන සංවර්ධනය කරමින් දූෂණය සහ අල්ලස වැළැක්වීම සඳහා අවශ්‍ය සියළු ක්‍රියාමාර්ග ගැනීම			100%

		16.9 උපත් ලියාපදිංචි කිරීම ද ඇතුළුව 2030 වන විට සියලු දෙනාටම නීතිමය අනන්‍යතාවයක් ලබා දීම. 16.10 ජාතික නීති පද්ධතියට සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්, ගිවිසුම්වලට අනුකූලව මහජනතාවට තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම සහ මූලික නිදහස ආරක්ෂා කිරීම තහවුරු කිරීම.	v) අලුත උපත් බිලිඳුන්ගේ උප්පැන්න ලියාපදිංචිය ඔවුන් ඉපදි මාස 3ක් ඇතුළත අවසන් කර අප්‍රමාදව උප්පැන්න සහතික නිකුත් කිරීම vi) තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඉල්ලුම්කරනු ලබන තොරතුරු කිසිදු ප්‍රමාදයකින් තොරව ලබාදීම			
17	තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය සහයෝගීතාවය ක්‍රියාත්මක කල හැකි විධික්‍රම හා නව පණගැන්වීම් ශක්තිමත් කිරීම.	17.1 බදු සහ වෙනත් ආදායම් එක්රැස් කිරීම් වර්ධනය කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට අන්තර්ජාතික සහයෝගය ලබා දීම ඇතුළුව දේශීය සම්පත් සජීවීකරණය.	I. පරිසර හිතකාමී තාක්ෂණය භාවිතයෙන් නව නිෂ්පාදන සිදුකිරීම සඳහා පුද්ගලයින් දිරිමත් කිරීමට විවිධ වැඩසටහන් පවත්වන ලදි. II. විවිධ දේශීය හා විදේශීය රාජ්‍ය නොවන සංවිධාන වලින් ලද ආධාර මුද්ල ග්‍රාමීය ප්‍රෙද්ශවල ජීවත් වන ජනතාවගේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා යොදවන ලදි. III. ප්ලාස්ටික් හා පොලිතීන් වෙනුවට ආදේශක ලෙස මැටි, වේවැල් වැනි ස්වභාවික ද්‍රව්‍ය භාවිතා කරමින් පරිසර හිතකාමි නිෂ්පාදන සිදුකිරීම පිළිබඳව දිස්ත්‍රික් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ නිලධාරින් හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයීය නිලධාරින් විසින් ග්‍රාමීය ව්‍යවසායකයින් දැනුවත් කරන ලදි.			100%

5.2 ළඟා කරගත් තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම හා එහිදී මුහුණ දුන් අභියෝග කෙටියෙන් විස්තර කරන්න.

තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමේදී පහත සඳහන් අභියෝගයන්ට මුහුණ දීමට සිදුවිය.

1. ආර්ථික අවපාතයෙන් පීඩාවට පත් ජනතාව නගා සිටුවීමේ අරමුණ පෙරදැරිව රජය විසින් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සීමා කර සමාජ සුභසාධන, කෘෂිකාර්මික හා ප්‍රජා සංවර්ධන වැඩසටහන් සඳහා ප්‍රමුඛත්වය දීම.

2. අත්‍යාවශ්‍ය ඖෂධ හා වෛද්‍ය උපකරණ සපයා ගැනීමේ අපහසුතාව

3. ෆෙන්ගල් සුළි සුළඟ සහ මෑනක ඇතිවූ ගංවතුර තත්ත්වය වැනි අයහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් දිස්ත්‍රික්කයේ ගොවීන් ඇතුළු ජනතාවට ගමනාගමන අපහසුතාවයන්ට හා අස්වැන්න හානි වීම වැනි දුෂ්කර තත්ත්වයන්ට මුහුණදීමට සිදුවීම.

4. රටෙහි පැවති ආර්ථික අවපාතය හේතුවෙන් දිස්ත්‍රික්කයේ ජනතාවගේ ආදායම් තත්ත්වය අඩුවීම හා දෛනික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා පෝෂ්‍යදායී ආහාර සපයා ගැනීමේ අපහසුතාව ආදි දුෂ්කරතා රැසකට මුහුණ දීමට සිදුවිය.

කෙසේ වෙතත් ඉහත සියළු බාධක, අභියෝග මධ්‍යයේ වුව ද බලාපොරොත්තු වූ ඉලක්ක පසුරා ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හැකි විය.

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

#	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්තය)	
			ඇබෑර්තු	අතිරික්තය
ජ්‍යෙෂ්ඨ	98	78	20	-
තෘතීයික	77	49	28	-
ද්විතියික	1934	2439	-	505
ප්‍රාථමික	256	242	14	-
එකතුව	**2365**	**2808**	**62**	**505**

06.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපෑම

අනුමත කාර්ය මණ්ඩලයට පරිභාහිරව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කර එවන ලද සංවර්ධන නිලධාරී පත්වීම් හේතුවෙන් නිලධාරී අතිරික්තයක් ඇත.

06.3 මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම*
				දේශීය	විදේශීය		
1.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සහ වත්කම් අපහරණය සඳහා එක් දින පුහුණුව (සිංහල)	31	2024.02.27	42,075.00	-	දේශීය	හොඳයි
2.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සහ වත්කම් අපහරණය සඳහා එක් දින පුහුණුව (දමිළ)	51	2024.02.28		-	දේශීය	හොඳයි
3.	ඉඩම් පරිපාලනය ඇතුළු ප්‍රාදේශීය පරිපාලනයේදී මුහුණදෙන ගැටළු කළමනාකරණය (සිංහල/ඉංග්‍රීසි)		2024.03.16	43,530.00	-	දේශීය	හොඳයි
4.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය දෙදින පුහුණු වැඩමුළුව (සිංහල)	44	2024.05.16 2024.05.17	82,835.00	-	දේශීය	හොඳයි
5.	ප්‍රසම්පාදන ක්‍රියාවලිය දෙදින පුහුණු වැඩමුළුව (දමිළ)	26	2024.05.07 2024.05.08		-	දේශීය	හොඳයි
6.	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් පැවැත්වූ ප්‍රායෝගික පුහුණු කිරීමේ වැඩමුළුව	53	2024.05.16	130,591.08	-	දේශීය	හොඳයි
7.	2024 නවක ග්‍රාම නිලධාරී සඳහා වන දින 15 (පැය 180) පුහුණුව (සිංහල)	20	2024.06.10 – 2024.07.03	544,165.00	-	දේශීය	හොඳයි
8.	2024 නවක ග්‍රාම නිලධාරී සඳහා වන දින 15 (පැය 180) පුහුණුව (සිංහල)	51					
9.	කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීමට අදාළ පාඨමාලාව (සිංහල)	34	2024.12.02 – 2024.12.13	348,660.00	-	දේශීය	හොඳයි
10.	කළමනාකරණ සේවා නිලධාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීමට අදාළ පාඨමාලාව (දමිළ)	23			-	දේශීය	හොඳයි
11.	අත්තිකාරම් ''බී'' ගිණුම්කරණය එක් දින පුහුණු වැඩමුළුව - 2024	44	2024.12.17	39,310.00	-	දේශීය	හොඳයි
12.	කළමනාකරණ සේවා නිලධාරී සහ සංවර්ධන නිලධාරීන් සඳහා කාර්යාල ක්‍රම එක්දින පුහුණු පාඨමාලාව - 2024	642	2024.12.18 2024.12.19 2024.12.20	523,100.00	-	දේශීය	හොඳයි

07. පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඬිනඩි ලේඛන/ පුද්ගල පඬිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		

9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට ඵලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		

14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම.	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම.	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම.	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම.	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම.**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		

18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරීදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

අවසානය.